**වර්ෂ 2022 අගෝස්තු 12 වන දින පෙ.ව. 09.30 ට පවත්වන්නට යෙදුනු කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ වාර්තාව :-**

- **සභාපතිතුමා මුලසුන ගැනිම** :- ගරු සභාපතිතුමා විසින් පැමිණි සිටි සියළු දෙනා පිලිගන්නා ලදී. මහ සභාවේ පෙ.ව. 9.30 වන විට සණ පූර්ණය නොමැති හෙයින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි ප්‍රේමාගම්ලත් මිය විසින් මහ සභාවේ කටයුතු පෙ.ව. 10 දක්වා කල්තැබීමට යෝජනා කල අතර එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි ඉන්ද්‍රාණි වික්‍රමසිංහ මිය විසින් ස්ථිර කරන ලදී.

පැමිණීම - මෙදින රැස්වීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රිතුමන්ලා සහ ගරු මන්ත්‍රිතුමියන්ලා සහභාගි විය.

| අනු.අ තනතුර | පක්ෂය | නම | පැමිණීම |
|---|---|---|---|
| 1. ගරු සභාපති | ශ්‍රී.ල.පො.පෙ | ප්‍රේමරත්න මල්කැකුල මහතා | පෙ.ව. 08.30 |
| 2. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ප්‍රේමා ගම්ලත් මිය | පෙ.ව. 08.30 |
| 3. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එච්.එම්.සී.එස්.ධනවර්ධන මහතා | පෙ.ව. 08.30 |
| 4. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.ඒ.මහින්ද විජේකුමාර මහතා | පෙ.ව. 08.33 |
| 5. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ආර් .සෝමරත්න මහතා | පෙ.ව. 09.15 |
| 6. ගරු ප්‍රාසම | එ.ජා.ප | ඉන්ද්‍රානි වික්‍රමසිංහ | පෙ.ව. 09.28 |
| 7. ගරු උපසභාපති | ශ්‍රී.ල.පො.පෙ | ඒ.ජේ.අනිල් ලියනගේ මහතා | පෙ.ව. 09.30 |
| 8. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | මංගල කිත්සිරි ඩයස් මහතා | පෙ.ව. 09.34 |
| 9. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කේ.ඒ.අසංක දිල්ෂාන් මහතා | පෙ.ව. 09.35 |
| 10. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | දීප්ති චන්දන මහතා | පෙ.ව. 09.40 |
| 11. ගරුප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | චන්දිම යුරේශ් පතිරණ මයා | පෙ.ව. 09.45 |
| 12. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එම්.කේ. විජේසිරි මහතා | පෙ.ව. 09.45 |
| 13. ගරු ප්‍රාසම | එ.ජා.ප. | ජී.ඊ.ඒ.රනිල් එදිරිසිංහ මහතා | පෙ.ව. 09.45 |
| 14. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කැළුම් ශ්‍රී ධර්මදාස මහතා | පෙ.ව. 09.40 |
| 15. ගරු ප්‍රාසම | එ.ජා.ප | චන්ද්‍රලතා බණ්ඩාර මිය | පෙ.ව. 09.45 |
| 16. ගරු ප්‍රාසම | ජ.වි.පෙ | ජී.ඒ.ජයසිංහ මහතා | පෙ.ව. 09.45 |
| 17. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ජී.ඩබ්.ජනක විමලසිරි මහතා | පෙ.ව. 09.47 |
| 18. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ආර්.ඩිලාන් දර්ශන රණසිංහ මහතා | පෙ.ව. 09.48 |
| 19. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එම්.ජී.ධනංජය වීරසේකර මහතා | පෙ.ව. 09.50 |
| 20. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ඩබ්.එම්.මදූෂාණි වීරසිංහ මිය | පෙ.ව. 09.50 |
| 21. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | මාලනී පීරිස් මිය | පෙ.ව. 09.50 |
| 22. ගරු ප්‍රාසම | එ.ජ.නි.ස. | ඩබ්.කේ.තිලකාවති මිය | පෙ.ව. 09.50 |
| 23. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.පී.තරංග නිල්මිණි මහතා | පෙ.ව. 09.55 |
| 24. ගරු ප්‍රාසම | එ.ජා.ප. | බී.ආර්.ඒ.එම්.එස්.සෝමරත්න මිය | පෙ.ව. 09.50 |
| 25. ගරු ප්‍රාසම | එ.ජා.ප. | අයි.කේ.රංජන් ප්‍රදීප් මහතා | පෙ.ව. 10.00 |
| 26. ගරු ප්‍රාසම | එ.ජ.නි.ස. | රොෂාන් දේශප්‍රිය මහතා | පෙ.ව. 10.10 |
| 27. ගරු ප්‍රාසම | එ.ජ.නි.ස. | එස්.ඩබ්.රන්ජිත් මෙන්ඩිස් මහතා | පෙ.ව. 10.12 |
| 28. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ඩී.එම්. ශානක දර්ශන මහතා | පෙ.ව. 10.13 |
| 29. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | රවීන් විනෝද් මහතා | පෙ.ව. 12.00 |
| 30. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.එච්.අසංක එරන්ද මහතා | පෙ.ව. 12.00 |
| 31. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.කේ.ලක්මාල් රුවන් කුමාර මහතා | පෙ.ව. 12.00 |
| 32. ගරු ප්‍රාසම | ශ්‍රී .ල.පො.පෙ | ජීවන් රණතුංගමහතා | පෙ.ව. 11.30 |
| 33. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | රුවන් අශෝක පතිරණ මහතා | පෙ.ව. 11.30 |
| 34. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.ඩබ්.එස්.සම්පත් බොතේජු මහතා | පෙ.ව. 11.31 |
| 35. ගරු ප්‍රාසම | එ.ජා.ප. | ප්‍රභාත් ජයසූරිය මහතා | පෙ.ව. 11.35 |
| 36. ගරු ප්‍රාසම | එ.ජා.ප. | කේ.එල්.එම්.ඩී.කරදන මිය | පෙ.ව. 11.40 |
| 37. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එච්.ඩබ්. ජයලත් මහතා | පෙ.ව. 11.45 |
| 38. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.රත්නසිරි මහතා | පෙ.ව. 11.45 |
| 39. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එම්.ඒ.දේවින්ද කුමාර මහතා | පෙ.ව. 11.50 |
| 40. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ජී.එම්. ජයරත්න මහතා | පෙ.ව. 02.36 |

01-1 පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සහා සම්මත කිරිම(2022.07.08)

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**

2022.07.08 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සහා සම්මත කරන ලෙස යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශ්‍රී ප්‍රේමා ගම්ලත් මිය**

2022.07.08 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා**

9.00 ට එන්නෙ නැති නිසා තින්දුවක් ගත්තා 9.30 ට රැස්වීම පවත්වන්න. නමුත් දැන් 9.30 ටත් එන්නේ නෑ.මේක සුදුසු නෑ.ජනතාව වෙනුවෙන් මාසෙට එක දිනක් නියමිත වෙලාවට එන්න බෑ කියන්නේ තේරුමක් නෑ.එහෙම කැප කරන්න බැරිනම් අයින් වෙන්න ඕනි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. සෝමරත්න මහතා**

වසර 26 ක්ම අපි මහාසභාවට නියමිත වේලාවට කලින් ඇවිත් සහභාගී උනා.මේ තත්වය වැරදියි.නිවැරදි කරගතයුතුයි.

සංශෝධන අංක 1

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා**

**22.07.08 වාර්තාවේ අංක 05-03 යෝජනාව සම්බන්ධව මා විසින් ප්‍රකාශ කල අවස්ථාවේ එම කොන්ඩගල ගාව මුකලාන ඉඩම මැන සුසාන භූමියට අයිති කොටස වෙන් කර වැඩිපුර ඉඩම් කොටසක් ඇත්නම් ඒ කොටස ඉල්ලුම් කරුට ලබා දෙන ලෙස ප්‍රකාශ කලා .නමුත් සභාතීරනයේ එම ඉඩම සුසාන භූමියට වෙන්කරඇති නිසා වෙනත් කටයුත්තක් සඳහා ලබා දිය නොහැකි බවට සඳහන්ව ඇත.**

සංශෝධන අංක 2

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා**

5 පිටුවේ පැරඩයිස් වැව සම්බන්ධ ගැටළුව .ගමේ අයගේ ලිපියක් සභාගත කලා .ඒබව සඳහන් කල යුතුයි.

සංශෝධන අංක 3

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

22.07.08 දින මහා සභා වාර්තාවේ තීරන අංක 05-04 හි කුරුවිට පහල කුරුවිට රණසිංහාරාම පන්සල අසල පාලම අසලින් ගල්ලෙනගාව වත්තට යන පාර සෝමා රණසිංහ මාවත ලෙස නම් කිරිමට සඳහා ඉදිරි කටයුතු කිරිමට තීරනය වූ අතර එය සංශෝධනය කර එම මාවත සෝමා මල්ලිකා රණසිංහ මාවත ලෙස නම්කිරිමට අවශ්‍ය ඉදිරිකටයුතු කිරිම ලෙස සංශෝධනය විය යුතුයි.

**Xxxxxxxxxxxxx** 2022.07.08 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව **ඒකමතිකව මහා සභා සම්මත විය. Xxxxxxxxxxx**

01-2 විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව සහා සම්මත කිරිම(2022.07.18)

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා

22.07.18 විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව මහා සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණි ප්‍රේමා ගම්ලත් මිය

22.07.18 විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව ස්ථිර කරමි.

සංශෝධන අංක 1

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

**මෙදින වාර්තාවේ ගරු මන්ත්‍රිතුමන්ලා 10.30 වන විට සහභාගී වී ඇත්තේ අට දෙනෙකු පමනයි.10.30 වන වට සනපූර්නය නොමැතිව ආරම්භ කල නොහැකියි.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**එම වේලාව සංශෝධනය විය යුතුයි.පෙ.ව. 11.05 ට මහාසභාව ආරම්භ කළ බවට සංශෝධනය විය යුතුයි.ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා නියමිත වේලාවට සභාව සඳහා සහභාගී කටයුතු කිරිම වගකිමක් ලෙස සැලකිය යුතුයි.එය තමන් විසින්ම සිදුකල යුත්තක්.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

**එසේම එදා නාගරික සංවර්ධන අධිකාරිය ඉදිරිපත්කල සැලසුම තව දුරටත් සංශෝධනය විය යුතුයි.නමුත් එය ඒකමතිකව සම්මත වු බවට දක්වලා.ඉදිරිපත් කිරිම කලාට එය මහා සභාවට සංශෝධන සහිතව ඉදිරිපත්කර අනුමැතිය ගත යුතුයි.ඒ සංශෝධන දැක්විය යුතුයි.**

සංශෝධන අංක 2

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි ඩබ්.කේ.තිලකාවතී මිය පැමිණිමේ ලේඛනයේ එ.ජා.ප ලෙස සඳහන්ව ඇති අතර එය එක්සත්ජනතා නිදහස් සන්ධානය ලෙස සංශෝධනය විය යුතුයි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx** 22.07.18 විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

## 2. සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන -

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**2023 වර්ෂයේ අයවැය සැකසීම වෙනුවෙන් ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා සමග සාකච්ඡාවක් පැවැත්වීමට තීරනය කල අතර එය 2022.08.240 බදාදා පෙ.ව.10 ට සභාවේදි පැවැත්වීමට නියමිතයි. සියළු ගරු මන්ත්‍රීතුමන්ලා සහභාගී වෙන්න.**

## 3. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද ලිපි සංදේශ , පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන -නොමැත

## 4. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න :- නොමැත

## 5. යථා පරිදි කල්දී ඇති යෝජනා :-

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා

**05-01 සූර්ය කෝෂ භාවිතයෙන් විදුලි බල ශක්තිය උත්පාදනය කිරිම සඳහා කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් සුදුසු ගොඩනැගිලි වල සූර්ය කෝෂ පැනල් ස්ථාපිත කිරීමේ යෝජනාව**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**මේවන විට දෛනිකව විහාල විදුලියප්‍රමානයක් දහනය වන අතර විශාල විදුලි බිලක් වැයවේ.මෙම ගැටළුවට විසඳුමක් ලෙස සූර්ය කෝෂ භාවිතයෙන් විදුලි බල ශක්තිය උත්පාදනය කිරිම සඳහා විධිමත් තාක්ෂනික උපදෙස් මත කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් සුදුසු ගොඩනැගිලි වල සූර්ය කෝෂ පැනල් ස්ථාපිත කිරීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

**එම යෝජනාව ස්ථිර කරමි.මෙම යෝජනාව වැදගත්.පුනර්ජනනනීය බල ශක්තිය වැදගත්. මීට පෙරත් කතා කලා.රාජ්‍ය ආයතන සහාය දුන්නේ නෑ.විවිධ මූලා සමාගම් එක්ක කතා කලා.**

**මේකෙන් විදුලිය ඉතිරි කරන්න වගේම විදුලිබල මණ්ඩලයට විදුලිය අලෙවිකරන්නත් පුළුවන්.**

සියයට අසූවක් මූලා සමාගම් අඩු පොලියට නයත් දෙනවා.ඉදිරියේ තියෙන තත්වය මත මේ කටයුත්ත එලදායී.අපේ සුදුසු ස්ථාන, වෙළඳ ගොඩනැගිල්ල උඩු මහල වගේ සුදුසු ඒවා ගන්න ඕනි.මේ කටයුතු වලට පුහුණු පිරිසක් ඕනි.ලංකාවේ තියෙන මේ තාක්ෂනය තියෙන ආයතන බලන්න.එසේම අඩු පොලියට නය දෙන මේවාට විශේෂ ආයතනත් හොයන්න.නිසි ප්‍රතිලාභයක් ගන්න හැකි ලෙස කටයුතු කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා</u>

සූර්ය කෝෂ භාවිතයෙන් විදුලි බල ශක්තිය උත්පාදනය මේ අවස්ථාවේ වැදගත්.මේ දැඩි ගැටළුකාර තත්වය හමුවේ රටට මෙවැනි කටයුත්තකින් හෝ සහනයක් ලැබෙන අයුරින් කටයුතු කල හැකි නම් වැදගත්.තවමත් රටේ ජනතාවට සහනයක් නෑ.විසඳුමක් නෑ.විදුලි බිල වැඩි කරලා.විශාල ආර්ථික අර්බුධයකට ඉදිරියේදි තවත් මුහුන දෙන්න වෙයි.ඒ නිසා යම් සාධනිය කටයුත්තකින් රටට ජාතික ආදායම වැඩිවන පරිදි ධනය උත්පාදනය කල යුතුයි. අද ආහාර ප්‍රශ්නයක් වෙලා.මන්දපෝෂනය ආයෙත් හිස ඔසවයි.විෂමාචාර වැඩිවෙලා.දැන් කුරුවිටත් සම්භාහන මධ්‍යස්ථානයක්.ඒක ගණිකා මධ්‍යස්ථානයක් .නීතිය රකින්න ඉන්න අයත් එතන.මම කතා කරන්නේ වේදනාවෙන්.නගරයයේ ගණිකා මධ්‍යස්ථානයක්.මේකටද නව පරපුරේ දියුණුව කියන්නේ.විප්ලව කලේ මේකටද? අපිට තියෙන සදාචාරය කොතනද?ශ රීරය විකුනලා ජීවිතය ගෙනියන්න තත්වයට කාන්තාවන් වැටිලා.නිති විරෝදි මත්දවා කසිප්පු හැමතැනම.පොදු වැසිකිලිය ලඟත් විකුනනවා.ගංජා කුඩු. මේ දේවල් සදාචාරය බින්දුවට දාලා. අළුත් දේශපාලන අරගලය ට ගහලා අකුලගෙන ගියා.ප්‍රජාතනත්‍රවාදි නායකයා පන්නලා ජනතාව ප්‍රතික්ෂේප කල අයෙක් රජවෙලා.මැතිවරන ක්‍රම වැඩක් නැතිවෙලා.
සභාවේ ගෙනාව යෝජනා ක්‍රියාත්මක උනේ නෑ. වැසිකිලිය හැදුවේ නෑ.දීමනා අරන් තේබිලා ගියාට වැඩක් නෑ.තව කෙටි කාලයයි තියෙන්නේ.දැන්වත් දැනෙන වැඩ කොටසක් කරමු. අපි ආදර්ශයක් දෙමු.අපි ගහකොළ, පරිසරය,මිනිස්සු රැකගන්න ඕනි.සභාවෙන් මුදල් වියදම් කරන්න බෑ. චක්‍ර ලේඛන අනුව.ඒත් අපිට පිට සල්ලි එපා .අපිට ආන්ඩුකාර අනුමැතිය විතරයි ඕනි.කලමනාකරනය කරගෙන වැඩ කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>
මේ වන විට විශාල වියදමක්.තුන් හතර ගුනයකින් වියදම ඉහල ගිහින්.විදුලිය උත්පාදනය කරලා විදුලි බල මණ්ඩලයට විකුනන එක ලාභයි.නමුත් පිරිවැයත් ඉහලයි.එසේම ස්පා මධ්‍යස්ථාන දැමීමට කීප දෙනෙක් ඉල්ලුවා. නමුත් ප්‍රතික්ෂේප උනා.වෙද මහත්වරුත් ඉල්ලුවා.විරුද්ධ උන නිසා ප්‍රතික්ෂේප උනා.සෝමරත්න මන්ත්‍රිතුමා කීව ස්පා එක ට බලපත්‍රත් දීලා.

අර චක්‍රෙල්ඛනය අර්ථ නිරූපන අනුව බලන්න.
සභා මුදල් අදාල නෑ.අපි ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ගත්තත් දැන් සබාවේ මුදල් නෑ.මේ වන විට කසිප්පුත් හැමතැනම.ඒවත් මිලත් වැඩිවෙලා.අදාල භාන්ඩ මිල ඉහල යනවිට ආදේශන මිලත් ඉහල යනවා.බලපත්‍ර තියෙන අරක්කු වගේ වල මිල අඩු කරන්න ඕනි.නැත්නම් රජය තීරනයක් අරන් මත්පැන් තහනම්ම කරන්න ඕනි.එතකොට සේරම තහනම්.සුදු ජාතිකයන් පුරුදු කල දේ.නැත්නම් තෙලිජ්ජ ,රා, වගේ දේ සිංහලයා භාවිත කලේ.කොහොම නමුත් හැමතැනම දැන් කසිප්පු විෂමාචාරයක් වෙලා.ජනතාවගේ ආදායමක් නැතිව මේ මත්පැන් එක්ක කාන්තාවෝ තවත් අසරන වෙනවා.ගෙවල්වල ලමයින්ට නිසි පෝෂනයක් නෑ.දරිද්‍රතාවය. රන්ඩු ,ඒවත් සමාජය තවත් පාතට දාලා.මුල මත්පැන් . ඒ නිසා සභාවක් ලෙස අපි යම් වැඩ පිලිවෙලක් හැදියයුතුයි මේ තත්වය පාලනය කරන්න.අපි අපේ ගම හදා ගත්තොත් අපිට අනාගතයක් තියෙනවා.මේ මත්ද්‍රව්‍ය ඇබ්බැහිය නවතන්න යම් දෙයක් කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී  මුදිතා සෝමරත්න මිය.

මේ වැනි අවස්ථාවක ආදායම් උත්පාදන ක්‍රමවේදයක් වශයෙන්ද මේක වැදගත්.මීට මාස කීපයකට පෙර උප සභාපතිතුමා යෝජනා කලත් මෙය සිදු උනේ නැ.ඒ නිසා මෙය සක්‍රිය කර ඉදිරි කටයුතු කරන්න.

ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා

සුදුසු උපදෙස්  අරන් ක්‍රියාත්මක කරමු.උප සභාපතිතුමා කීව ලෙස අඩු පොලියට හෝ නයක් හෝ අරන්මෙය සුදුසු තාක්ෂන උපදෙස් අරන් කරමු.ගරු මන්ත්‍රීතුමා කීව ලෙස ස්පා ආයතනයකට බලපත්‍ර දීලා නැ.ඉල්ලීමක් දුන්න.තව දුරට කරුණු හොයනවා.මේක අයදුම් පත්‍රයක්. ලැබුනාම ඒකට කටයුතු නොකර බැ. හේතුවක් නැතිව අපිට බැ කියන්නබැ. ඒක නීතියට පටහැනියි.ඒ අයදුම් පත්‍රයේ  වාර්තා කීපයක් තියෙනවා.පාදේශිය ලේකම,මහජන සෞඛ්‍ය පරීක්ෂක,පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක අත්සන් කරලා.මේ සම්බන්ධව සෝමරත්න මන්ත්‍රීතුමා ලිඛිතව දුන්න.මේ ගැන සොයනවා. සභාවෙන් බලපත්‍රයක් දුන්නා කියන්නේ අසත්‍යයක්.මේක නතිය වෙන දෙයක්.  සභාවට අදාල ටික යි අපි කරන්නේ.කෙසේ නමුත් මෙතෙක් බලපත්‍රයක් දීලා නැ.මුදල් බැදපු රිසිට් පතක් පමනක් තියෙන්නේ.එය බලපත්‍රයක් නොවේ.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

නීතිය අනුව බලපත්‍රයක් නැත්නම් ක්‍රියාත්මක කරන්නත් බැ.ඒ නිසා නීතිමය කටයුතු කරන්න සොයා බලන්න.අකටයුතු වනවා නම් පොලිසිය දැනුවත් කරන්න.බලය තියෙනවා ඒ අයට .

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  මංගල ඩයස් මහතා

ගෝනපිටිය තියෙනවා එකක්. ඒක බලපත්‍ර අරන්.

ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා

සෞඛ්‍ය අංශයේ කාරනා වගයක් තියෙනවා. ඒ අය පරීක්ෂා කරනවා.අවශ්‍ය කරුනු සපුරලා නම් අපිට ගැටළුවක්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  ආර්.සෝමරත්න මහතා

ඒක ස්පා නමින් පවත්වන ගණිකා මඩමක්.සභාවට හැකියි නාම පුවරුව ඉවත් කරන්න.

ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා

පොලිසිය දැනුවත් කරමු. නීතිය ක්‍රියාත්මක කරන්න කියලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  ඩිලාන් දර්ශන මහතා

ස්පා කීයකට සභා බල ප්‍රෙද්ශයේ බලපත්‍ර දීලා තියෙනවද?අනුමැතිය දීලා නැති ඒවත් තියෙනවද?

ටිකිරි වයින් එක ලඟත් එකක් තියෙනවා.සභා අවසර තොරව.විනය රකින අය ඒ කටයුතු කලයුතුයි.මේ වන විට ගණිකා, කසිප්පු වගේ දේවල් නිසා විෂමාචාර වැඩිවෙලා.නගරයේ පොදු ස්ථානවල කසිප්පු විකුනනවා.නගරය හදන්න බෑ. මේක අපකීර්තියක්.මේවා ගැන තින්දු ගත හැකි එකම ආයතනය පොලීසියද? අපිට එහෙම හිතලා අතපිහදාගන්න බෑ.ඊට උඩින් ඉන්න අයට දැනුම්දෙන්න පුවවන්.මාධ්‍යට යමක් කල හැකියි.මේ විෂම කටයුතුවලට විරුද්ධව සාමූහික තීන්දු ගත්තා කියලා දාන්න.ඉල්ල
ඉල්ලීමක් කරනවා.සභාව මේ නීති විරෝධී ස්පා වලට විරුද්ධව තීන්දුවක් ගත්බව ත් ඒවා ක්‍රියාත්මක කරන්නත් කටයුතු කරන්න.
කුරුවිට ස්ථානාධිපතිතුමා නම්‍යශීලියි.මේ කරුනෙදි අර ලදුපත දීලා නිසා ඒක පෙන්නලා වැඩටික කරගෙන.තාවකාලික අවසරයක්.ප්‍රායෝගිකව එහෙම වෙනවා. නමුත් අපි මේතත්වය සතියක් බලලා විසඳුමක් නොවුනොත් රත්නපුර ප්‍රධාන කාර්යාලයට ගිහින් විසඳමු.අවසර නැති සියළු ස්පා ගැන තොරතුරු අරන් නීත්‍යානුකූලව කටයුතු කරන්න. නැතිඒවා වහන්න.කොන්දේසි දමලා නැවත ගැටළු ආවොත් බලපත්‍රත් නොදී ඉන්නත් පුළුවන්.නඩු දාන්නත්පුළුවන්.අපේ පරිසරයේ යමකට අවසර දෙනවා නම් සුදුසු කොන්දේසි ඇතිව අවසර දිය හැකියි. ඒ අවසරයෙන් පිට වෙනත් කටයුතු කලොත් උසාවි ගියත් අපිට බලපත්‍ර නොදි හිටිය හැකියි.අර කොන්දේසි පිට අවසරය නිසා. ඩොක්ටර් ගෙන් ගන්න අවසර වලට දවල්ට එකක් කරලා වෙන දේවලුත් නීතියට හොරෙන් කරන්න පුළුවන්.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

පළාත් පාලන ආයතනවලට නීතිරාමුවක් තියෙනවා.බලපත්‍රදීමේදිත් එහෙමයි.මේ ස්පා වලට ක්‍රියාදාමයක් තියෙනවා.ඒ අතරේ කොට්ඨාසේ මන්ත්‍රී ලෙස දැනුම් දුන්නම ඒ ගැන සොයා බැළුවා.අයදුම් කිරිමට ඉල්ලුම් පත්‍ර පවා දී නැති ස්පා කීපයක් තියෙනවා.පැරඩයිස් එක නීත්‍යානුකූලව කලේ. ඒක වහලද?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා
කුරුවිට සිට බදුවත්ත දක්වා කීපයක් තියෙනවා.ශාන් එක ඉදිරිපිටත් තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
සභා බල ප්‍රෙද්ශයේ මේ ස්පා ආයතන විස්තර අරන් අනවසර ඒවා පිලිබඳ කටයුතු කරන්න.තව වසර 20-25 යනකොට ස්පා ලඟ ලඟ තියෙයි.කොහොම උනත් මේ නීත්‍යානු කූල නැති ස්පා සියල්ල ගැන කටයුතු කරන්න.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

Xxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව සූර්ය කෝෂ භාවිතයෙන් විදුලි බල ශක්තිය උත්පාදනය කිරිම සඳහා විධිමත් තාක්ෂනික උපදෙස් මත කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් සුදුසු ගොඩනැගිලි වල සූර්ය කෝෂ පැනල් ස්ථාපිත කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx

**05-02** රට අර්බුධයට පත්ව ඇති අවස්ථාවේ යලි යථා තත්වයට පත්කර ගොඩනංවා සිටුවිම සඳහා අභිනවයෙන් පත්වූ ගරු ජනාධිපතිතුමාට හා ඉදිරියේ පිහිටුවීමට නියමිත සර්වපාක්ෂික ආණ්ඩුවට සියළු පළාත් පාලන ආයතනවල සහාය පල කිරීමේ යෝජනාව.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

රට අර්බුධයට පත්ව ඇති අවස්ථාවේ යලි යථා තත්වයට පත්කර ගොඩනංවා සිටුවිම සඳහා අභිනවයෙන් පත්වූ ගරු ජනාධිපතිතුමාට හා ඉදිරියේ පිහිටුවීමට නියමිත සර්වපාක්ෂික ආණ්ඩුවට සියළු පළාත් පාලන ආයතනවල සහාය පල කිරීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

පළාත් පාලන ආයතන ලෙස සහාය ලබාදිම වැදගත් කොට මා සලකනවා.මේ රටේ 225 ක් පත් කලේ රටේ අනාගතය යහපත් කිරිමටයි.නමුත් මේ 225ට අවශ්‍යතාවක් නෑ.නමුත් වෙනසක් දකින්න මැතිවරණ ,විරෝධතා වලිනුත් බැරිඋනා.ඒවාට නිසි නායකත්වයක් තිබුනේ නෑ.නමුත් බලාපොරොත්තු වෙනවා මේ පිරිස එකතු වෙලා සර්වපාක්ෂික ආන්ඩුව පිහිටුවලා රටට සුභ අනාගතයක් හදයි කියලා. ගරු රනිල් ජනාධිපතිතුමා වගකීම භාරගෙන ඒ ආව ගමන් මග ගැන මට සතුටුයි.පුද්ගලිකවත් සුභ පතනවා. රටේ වගකීම් යුතුකම් ඉටුකරමින් රට නැවත ගොඩනැගීමට ශක්තිය දිරිය පතමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා</u>

නව ජනපතිතුමාට සුභ පතමි.මේ අවස්ථාවේ ප්‍රකාශ කල අයුරින්ම රටේ පාර්ලිමේන්තුවේ සමහර මන්ත්‍රිතුමන්ලා සුළුතරයක් පටු අරමුණු වලයි ඉන්නේ.ඊට ප්‍රධාන හේතු තියෙනවා.රනිල් මහත්තයා මීට පෙර බලයට ඇවිත් රට ගැන හිතලා වැඩ කරලා බලයත් අහිමි උනා.පස්සේ ඉවත් උනා.

කෙසේ නමුත් හිටපු ගරු ජනපතිතුමාගේ මතින් ගියේ රටේ වසර ගානක සිට තිබුන අවපාතයයි.සියළු පව්වලට කරගහන්න සිද්ධ වුනා.

නමුත් මේ සියළු ගැටළු මැද ගරු රනිල් ජනාධිපතිතුමා රට වෙනුවෙන් ගන්නා තින්දු තීරන සාර්ථක උවහොත් රටේ මේ දැවෙන ප්‍රශ්න ගෑසි,තෙල්,ආදී ගැටළු සියල්ල විසඳාගත හැකියි.පක්ෂය ප්‍රවර්ධනය නෙවෙයි. මේ හදන්නේ රට නගා සිටුවිමටයි.ගරු රනිල් ජනාධිපතිතුමාට සියළු දෙනා එනතුවෙලා සියළු ගැටළු නිරාකරනය කරන්න ශක්තිය දිරිය ප්‍රාර්ථනා කරමි.එතුමාගේ දර්ශනය මල්පල ගැනේවා පතමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>
පළාත් පාලන ආයතන වල සහාය පල කිරිම යෝජනාව. මේ පිලිබද කතාකරන්න කල් වැඩි ලෙසයි මා දකින්නේ.එතුමා ප්‍රායෝගිකව දේශපාලනය කල අයෙක්.අපිට වැරදුනේ ප්‍රාදේශීය

සභාවක හෝ දේශපාලනය නොකල අයෙක්ව පත් කර ගැනීමයි.රනිල් මහත්මයා සාකච්ඡා කරන අයෙක්.පොදු මතය බලනවා.මහින්ද මැතිතුමාත් එහෙමයි. අපිත් එක්ක කතා කලා.ජනතාවගේ දුක හඳුනාගතයුතුයි නායකයෙක්. නමුත් ගෝඨාභය මහත්තයා කාටවත් නොකියාම යන්න ගියා.අපේ වසර 32 ක දේශපාලනය මහන්සිය අපතේ ඇරියා.අවම වශයෙන් ප්‍රාදේශිය සභාවකවත් හිටි අයෙක් රටේ ජනාධිපති විය යුත්තේ.දැන් ලොකුම ගැටළුව ආර්ථික ප්‍රශ්න.ඉන්ධන ලයිට් බිල දිනෙන් දින ඉහල යනවා.විදුලි බල මණ්ඩලයේ අයථා කටයුතු විෂමාචාර නිසා පාඩු ලබනවා.පඩි ඉතා ඉහලයි.සාමාන්‍ය ජනතාවයි මේවායිනුත් දුක් විඳින්නේ.

අපි විරුද්ධ විය යුතුයි.විධායක ජනපති ක්‍රමය අහෝසි කලොත් තවත් රට වලපල්ලට යයි.ගෙදරක ගෘහ මූලිකයට බලයක් තිබිය යුතුයි ගෙදර. නැත්නම් දියුණුවක් නෑ.විධායක බලතල තිබුන නිසයි රනිල් මහත්තයත් ජනාධිපති උනේ.77 පාසැල් යන කාලේ අපිත් ධවලපත්‍රිකාවට විරුද්ධ උනා.විධායක ක්‍රමයට පක්ෂයි.මේ සභාපතිතුමාට විධායක බලය නැත්නම් සභාව වත් හරියට කරන්න බෑ.පාර්ලිමේන්තුවේ 225 න් භාගයක් විතර ප්‍රතිපත්තියක් තියෙන අය.නායකයා ඕනි නිසි විදිහට මෙහෙයවලා කටයුතු කරන්න.හාල් මිලත් ඉහලයි.පෝර විශාල ගැටළුවක් වෙයි කියලා මමත් කීවා ජනාධිපතිතුමාට .නමුත් ඒවා දුර දිගට සැලකුවේ නෑ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන මහතා</u>

69 ලක්ෂයක් චන්දය දීලා 17 ලක්ෂ ගානකින් දිනලා පාර්ලිමේන්තුවේ වැඩි බලයත් අරගෙන වසර දෙකක් යන්නත් කලින් සර්ව පාක්ෂික රජයක අවශ්‍යතාවක් උනේ ඇයි. ඇත්තටම ගෝඨාභය මැතිතුමා ජනාධිපති උනාට පස්සේ එතුමා විශාල ගැටළු රැසකට මුහුණ දුන්නා.අර්බුධ රැසක් උනා.කොවිඩ් ආවා. එතුමා ඒක හරි විදිහට කලමනාකරනය කරලා ජය ගත්තා.එහෙම තියෙන අතරෙයි රටේ ආයෝජන අඩුවෙලා විදේශ විනිමය අඩු උනේ.විශාල දේශපාලන අර්බුධ ඇති අනා.උන්ඩියල් ක්‍රමය ප්‍රචලිත වෙලා.හාල් තෙල් මූලික අවශ්‍යතා කරගන්න බැරි උනා.බඩුටික ගන්න ජනතාව කඩේට ගියාම කුපිත වෙනවා. එහෙම වෙලාවේ තමා අවස්ථාවාදීරාජපක්ෂ විරෝධී කාණ්ඩය රාජපක්ෂලා දේශපාලනයෙන් ඉවත් කරන්න කටයුතු කලා.රටේ මේ තත්වය උනේ රාජපක්ෂලා හොරකම් කරලා විනාශ කරලා නිසා බවක් නිර්මාණය කලා.අරගල කලා.මේක නිමවෙන්න තිබුන අරගලයක්.නමුත් ඒකට පහර දිලා නොතිබුන වටිනාකමක් දුන්නා. නිර්භිත නැතිකම නායකයා වගකීම පැහැරහැරීම නිසා අයින්වෙන්න උනා.නව ජනපති කෙනෙක් පත්කලයුතු අනා.එය නිවැරදිව නම් ව්‍යවස්ථානුකූල විය යුතුයි. එක් එක් අයට ඕනි විදිහට බෑ.නමුත් රනිල් මහත්තයා අරගලයේ සැබෑ තත්වය නිරාවරනය කලා.එහි ඇති අනීතික දේ ඉවත් කලා.අනවසර ඉදිකිරිම් ඉවත් කලා.අරගලය ඉවත් උනා.ගෝඨාභය මහත්තයටත් තිබුනා ආයුධ දාලා මේක පාලනය කරන්න.නමුත් ඒ නායකත්වය දූර්වල උනා.කෙහොම හරි දැන් පෙට්‍රල් පෝලිම අඩුයි.කෙටි කාලයක් තුල ඉන්ධන ගන්න පුළුවන්.අපි චන්දය දිපු කෙනාට කරන්න බැරි උන දේ එතුමා බිය සැක නැතිවම කලා.එතුමා ට තර කරන්න දේපොල අවශ්‍ය කෙනෙක් නෙමෙයි.ගිනි තියපු ගේත් එතුමාගේ පාසැලට දෙන්න තිබුන එකක්. පරපුරක් නෑ .එතුමා නිසි දේ කරයි. මුළු රටම බලාපොරොත්තුවෙන් ඉන්නේ එතුම ආයෙත් රටට සෞභාග්‍ය කැන්දයි කියලා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා</u>

රටේ විශාල අර්බුධ රැසක් මැද සියළු මැතිවරන ජය අරන් ගෝඨාභය මැතිතුමා විධායක ජනාධිපති උනා.කොවිඩ් කාලේ රටේ නායකයා ලෙස මැදිහත් වෙලා ඒකත් ජය ගත්තා.නමුත් අපි නායකයව පත් කලේ නතර වෙන්න නෙවෙයි.සිදුඋනේ නිලධාරින්ගේ වැරදි උපදෙස් නිසා

එතුමාටත් යන්න උන එක්.වියත් මග නිසා නැති අනා.අපි හිටියා නම් ඊට වඩා නිවැරදි මග පෙන්වීමක් කල හැකිව තිබුනා .එසෙම ජනතාවගේ දුක සැප කඳුල නායකයා හඳුනන්න ඕනි. නැතිව වැඩක් නෑ.මෙතුමා ගත්ත තින්දු නිසා ගොවිතැන නැති උනා. ගොවියා පාරට වැටුනා.බලාපොරොත්තු උන අස්වැන්න නැතිව ගියා. මේ තුල ගොවියා උද්ගෝෂන කලා.ගෝල් ෆේස් එකේ උද්ගෝෂන කරන්න තැනක් දුන්නා.බැටන් ප්‍රහාර නතර කලා.යම් සුළුතරයක් දූර්වල ආන්ඩුව ගෙදර පන්නන්න කටයුතු කලා. රටම පෝලිම්.ආහාර , තෙල්, ඩොලර් නෑ.පිටරටින් බඩු ගේන්න සල්ලි නෑ.ගෝල් ෆේස් එකට ගහපු එකට මාත් විරුද්ධයි.නමුත් මේ අරගලය මැද රටේ නායකයන්ගේ ගෙවල් ගිනි තිබ්බා.සංවිධානාත්මක භීෂනයක් පෙන්නුවේ.හිටපු ජනපතිගේ දෙමව්පියන්ගේ පිලි රූ කඩා බිම දැම්මා.පාලනය කරගන්න බැරිඋනා.ආරක්ෂක ලේකම්,උතුරේ යුද්ධය ජයගත්තා.කොළඹ පුදුම විදිහට අලංකාර කලා.නමුත් විධායක බලතල තිබිලත් මේක නතර කරගන්න බැරිඋනා. අරගල කරුවෝ ජාතික දේපල අල්ලා ගත්තා.ලැජ්ජා නැති විදිහට හැසිරිලා වීරයෝ උනා. රටේ නායකායෝ දෙන්නම රටින් ගියා.නිතිය අවනීතිය උනා.රනිල් මහත්තයා අගමැති උනා.එතුමා දේශපාලන ඉතිහාසයක් තියෙන කෙනෙක්. දුරදිග දකින ඥානයක් තියෙන බුද්ධිමත් අයෙක්. ඒත් රටේ ව්‍යවස්ථාව ආරක්ෂාකල යුතුයි.නීතිය රැකිය යුතුයි.එවේලේ රනිල් මහත්තයට අගමැති කලා.මමත් අනුමත කරන්නෑ. නමුත් සාධාරනය රකින්න නම් උන්ඩෙන් හරි පාලනය කරන්න ඕනි.ප්‍රෙමදාස මහත්තයාගේ කාලේ ත් එහෙමයි. උතුරේ යුද්ධය යුද්ධෙන් ජය නොගත්තානම් අද කුරුවිටත් අල්ලලා.විජයවීර අපි දැක්කා.ඒවා සාධාරන නෑ.නමුත් යහමගට ගන්න බැරිනම් වෙන මොනා කරන්නද? රටක් පාලනය කරද්දි රටේ විධායකය නිතිය ව්‍යවස්ථාව ආරක්ෂා කරන්න බැරි නායකයෙක් ගෙන් වැඩක් නෑ.රනිල් මහත්තයා වයවස්ථාව රැක්කා.රජයේ දේපොල විනාශ කිරිම වැරදියි.පැක්ටරි වලට ගිනි තිබ්බා.එදාත් ලංගම ගිනි තිබ්බා.රටේ දේපොල ගිනි තියලා ඒවා අවභාවිත කරලා රටක් හදන්න පුළුවන්ද?225 ක් ඉන්නවා. මේ ජනපතිතුමා යම් තැනකට රට ගෙන යාවි.අභියෝග රැසක් එක්ක රනිල් මහත්තයා රට භාර ගත්තේ.අපි මොනතරම් කැප වෙලා මැතිවරන ජයග්‍රහන ලබා දුන්නත් ගෝඨාභය මහත්තයා අපිට සැලකුවේ නෑ. ගමේ නායකයාව ලංකර ගත්තේ නෑ.කතා කලේ නෑ.ඒ නිසයි යන්න උනේ.සේරම අපේක්ෂා සුන් උනා.මේ දෙන හාල් ටිකවත් දෙන්න අපිට සම්බන්ධයක් නෑ.මහින්ද මහත්තයට ගරු කරනවා. එතුමා අපි එක්ක කතා කලා.නිලධාරිවාදය විතරක් අරන් කටයුතු කරලා ගෝඨාභය මහත්තයට යන්න උනා. මේ තත්වයට වග කින්න ඕනි.පොහෝට්ටුව හැදුවේ අපි.එදා යහපාලන කාලේ අපි මහින්ද මහත්තයා එක්ක නුගේගොඩින් පටන් අරන් නුවර, කොළඹ පාගමන් ආවා. ආණ්ඩුව බලයට පත් කලා.ගෝඨාභය මහත්තයා අපිව අත් ඇරියා.

දැන් මේ නායකයා ලොවම දිනයි.එතුමා රටේ ජනතා පිඩනය අඩුකරයි.මගේ පූර්න සහාය මම දෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පි.ඒ. ජයසිංහ මහතා</u>

රටේ දැඩි ආර්ථික අර්බුධ හමුවේ ජනතාව පාරට බැස්සා. මහජනතාව ඉල්ලුවේ සාධාරන අයිතින් .සහන ඉල්ලුවේ.බඩුමිල ඉහලයි.නමුත් ජනතාවට කන් දුන්නේ නෑ.තරුණ පිරිස චිත්‍ර ඇන්දේ වෙනසක් කරන්න.යහපත් හෙට දවසක් හිතුවා. ඒත් දිනෙන්දින අසහනය විතරයි.දියුණුවකට මුල පිරුවේ නෑ.ඩොලර් අර්බුධය,රසායන පෝරනෑ.රටේ උගත්තු මහාචාර්ය වරු උපදෙස් දුන්නත් ඒවා ගනන් ගත්තේ නෑ.කාබනික පෝර පමනක් වගාවලට යාමට පෙර දුර දක්නා සැලසුම් අවශ්‍ය බව කොතෙක් කීවත් ඒවා ඇහුවේ නෑ. ආදායම් පූර්න අක්‍රිය උනා.ඩොලර් නෑ.රට ඉදිරියට ගෙනියන්න බෑ.එක පක්ෂෙකට විතරක් නෙමෙයි මේ ගැටළු. හැමෝම ජීවත්

වෙන්න සුදුසු පරිසරයකුයි ඉල්ලුවේ.සාධාරන සමාජයකුයි ඉල්ලුවේ.අන්තිමට ජනතාව පාරට බැස්සා. අරගල වල හොඳ නරක දෙකම තියෙනවා. ඒක තමා ස්වභාවට.අරගල ,යුද්ධය මැද හොද දේ විතරක් බලාපොරොත්තු වෙන්න බෑ.ඒක තමා ස්වභාවය.යුද්ධෙදි අනිවාර්යෙන් මැරෙනවා.අන්තිමට මහින්ද මහත්තයත් ගෝඨාභය මහත්තයත් යන්න ගියා.පාර්ලිමේන්තුවේ බහුතර ජන්දෙන් රනිල් මහත්තයා ජනපති උනා.නමුත් ප්‍රතිපත්තියක් නෑ.දෙබිඩි ප්‍රතිපත්තිවලට අපි එකඟ නෑ.රට ස්ථාවර කරන්න නම් අවංක ප්‍රතිපත්තියක් ඕනි. රට වෙනුවෙන් යහපත් අවංක වැඩපිලිවෙලක් ඕනි.එහෙම වැඩපිලිවෙලක් ඉදිරිපත් කරනවා නම් අපි එකඟයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මුදිතා සෝමරත්න මහතා</u>

අර්බුධයට විසඳුම් සොයන්න 225 අතරින් ජනපති අගමැති පත්කර ගෙන රට ඉදිරියට ගෙනියන්නයි හදන්නේ.ආණ්ඩු පක්ෂෙයි විපක්ෂෙයි මේ විදිහට එකඟ වෙනවා අඩුයි.නමුත් දැන් එක තිරනයකට ආවා.අනීතික නම් අධිකරනයට යන්න පුළුවන්.ජනතාවට තුන්වේල කන්න පුළුවන් විදිහට මේ ආර්ථිකය හදනවා නම් ඒකයි මුලින්ම වැදගත්. ජනාධිපතිතුමා කීව ලෙසම යුතුකම ඉටු කරයි කියලා හිතනවා. සුභපතනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

මේ රටේ ගැටළුව මහජන නියෝජිතයින් රටේ ජනතාවගේ අභිලාශ ඉටු නොකිරිම සම්බන්ධව. රටට නිදහස ලැබුනාම මව් භාෂාව,නිදහස් අධ්‍යාපනය,සෞඛ්‍ය, සුභසාධන ආදිය නිවැරදිව නිදහසේ ගමනක් ගියා. අභාග්‍යට මේවා ප්‍රතිසංස්කරනයක් උනේ නෑ.කොරෝනා තුල ලොවටම පාඩමක් කියා දුන්නා.කුඩා රටක් ලෙස බලවත් රටවල් අභිබවා ගියා.නමුත් කොරෝනා සිට මේ දක්වා රට සමාජ, දේශපාලන අර්බුධ රැසකට මුහුණ දුන්නා.කොරෝනා ජය ගත්තත් ආර්ථිකය කඩා වැටුනා.පෝර ගැටළුව දැඩි උනා. එක රැයෙන් කාබනික වගා කරන්න බෑ.සියයට සියයක් කෙසේවත් බෑ.ගොවිතැන කඩා වැටුනා,නිෂ්පාදනය අඩු උනා,අපනයනය අඩු උනා.ජනතාවගේ අත්‍යවශ්‍ය දේ ඉල්ලුමට සරිලන සැපයුමක් නෑ.ඉතින් පෝලිම්.මේ ආර්ථිකය තුල ජනතාව තිරිසනුන් වෙනවා. කළකඩ, ආතතිය,අවසානයේ විරෝධතාවය විවිධ ලෙස ප්‍රකාශ කලා.නායකයා තම දැනුමට සීමා කරලා තීන්දු තීරන අරන්.බුද්ධිමත් නායකත්ව අතීතයේත් පක්ෂ විපක්ෂව හිටියා. එන්.එම්.පෙරේරා මැතිතුමා,වන්නිනායක මැතිතුමා,ජේ.ආර්.ජයවර්ධන මැතිතුමා,වගේ නිර්මාණශීලී නායකයෝ රටේ හිටියා. 2020 අයවැය විශාල වෙනසක් වෙයි කියලා හිතුවා.ඒත් ආපු ගමනේ වෙනසක් උනේ නෑ.සීනි, සුදුළුනු, වැට් වංචා විතරයි.තෙල් පෝර බෙහෙත් නෑ.අපිට හොඳ අධ්‍යාපනයක් ලැබුනා.නිදහස් අධ්‍යාපනයට පින් සිද්ධ වෙන්න.අපි වහල් බවින් ගැලවෙමු.දේශපාලන යාන්ත්‍රනය එහාට යන්න ඕනි.හිටපු පාලකයෝ අපිත් එක්ක කතා කලේ නෑ.කළු ගඟ සිද්ධිය ජනපතිට දන්වා ඇරියා.උත්තර නෑ.මේ අපේ උපන් බිම.සමහරුන්ට විදේශ රටවල් තියෙනවා.අපිට නෑ.අපි ආයේ ආවේ හිටපු තැනටමයි.සෞභාග්‍ය දැක්ම කියලා ආවේ පරන තැනටමයි.ක්‍රමයේ වැරැද්ද.77න් පස්සේ බොහෝ අය හිතුවේ තමන් ගැනයි. අතීතයේ නායකයන්ට මිය යනකොට තත්වයයි අද තත්වයයි ඉඳුරා වෙනස්.අධිරාජවාදි බලවේග වල බලපෑමත් එහෙමයි.ගෝඨාභය මහත්තයටත් අධිරාජවාදිබලපෑම ප්‍රබල උනා.මේක අනිල් මහත්තයා පස්සේත් නොජිවි කියලා හිතන්න බෑ.මේ අයට අත්පුඩි ගැසීම නෙවේ වෙන්න ඕනි.මේ බිමේ තියෙන පීඩනය මේ අය එක්ක බෙදා ගැනීමයි. තාම වැඩවසම්ක්‍රමය තියෙනවා.අපේ රටේ පීඩාවට පත්උන ජනතාව, බැඳුම්කර වංචාව, වෙනුවෙන් ඒවා වෙනුවෙන් මට අත්පුඩි ගහන්න බෑ.මේ අඳුරෙන් පස්සේ ආලෝකය දිස්වෙයි.මේ රටේ ජනතා පාර්ථනා මුදුන් පත් කරන නිර්මාණශිලි නායකත්වයක් බිහිවෙයි කියලා හිතනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.එස්.එස්. ධනවර්ධන මහතා

ගරු රනිල් ජනාධිපතිතුමා රට අර්බුධ වෙලේ භාරගත්තා.එතුමාට පක්ෂ විපක්ෂ හැමෝම එකතු වෙලා භාර දුන්නා.මේ වෙලාවේ රට ගොඩගන්න ඉන්නේ එතුමයි.සුභ පතනවා.සහාය ලබා දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා

මේ යෝජනාව ඉදිරිපත් කිරිම ගැන පුද්ගලිකව ස්තුති කරනවා. අපි දන්න කෙනා. සියල්ල සිදුවන්නේ පොදු ධර්මතාවය මතයි.රකින්න පරපුරක් නැති යහපත් අයෙක් පත් උනා.කෙසේ වුවත් මේ වෙලාවේ රටේ අර්බුධ. විදුලි අර්බුධ.ඉන්ධන අර්බුධයට සියයට පහක් බලපෑවා.අපේ රටේ ජල විදුලි බලාගාර වල ක්‍රියා කාරිත්වය ජල පද්දතිය වැව් වලින් නිදහස් කරන ක්‍රමවේදය වෙනස් වෙලා.නියං කාලේ ගබඩා වියයුතු ජල ප්‍රමානය නැතිවෙලා.ඒ වගේ දේවල් කුමන්ත්‍රණ.ඒවාට හවුල් අයට අපි කැමති නෑ. රනිල් මහත්තයා අත්දැකීම් තියෙන කෙනෙක්.රට ගැන හිතලා මේ වෙලාවේ එතුමා භාරගත්තා.හැමතැනම භිෂනය තිබුනවෙලේ ගෝඨාභය මැතිතුමා යන්න ගියා. හැබැයි එතුමා අරන්ගියේ නෝනා විතරයි.වෙන මොකුත් ගෙනිච්චේ නෑ.

රනිල් මහත්තයට සුභ පතනවා.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

දිර්ඝ ලෙස කරුණු දැක්වුවා.බහුතර මතය රනිල් මහත්තයා ඇතුළු ආණ්ඩුවට සුභ පැතීම. මොනා කලත් කාටත් විරෝධය පාන අයත් ඉන්නවා.ජවිපෙත් කලක් මේ ලෙසම රටට පීඩනය භීෂනය ගෙන ආවා.71 කාලේ රටටම භීෂනය ගෙන ආවා.කෙසේ උනත් මේවෙලාවේ ගරු රනිල් ජනාධිපතිතුමා සියළු දෙනා සාකච්ජාවට කැඳවලා.නමුත් සමහරු මේ සාකච්ජාවට ඒවට එන්නේ නැතිළු.රටට ඇත්තටම ආදරය නම් ඒවට සහභාගීවෙලා කටයුතු කරන්න ඕනි.ඒනිසා නැතත් කියන්නේ මේ සියළු ගැටළු මැද ගරු රනිල් ජනාධිපතිතුමා දිරිය ශක්තිය පතනවා රට ට නැවත සෞභාගය උදාකරන්න හැකිවෙන්න කියලා.අරගල මැද නොයෙක් අකටයුතු උනා.සජිත් මහත්තයට ගැහුවත්.සමහරුන්ගේ දේශපාලන මත.සාකච්ජා කරලා අදහස් අරගෙන ජනාධිපතිතුමා ඉදිරියට රට අරන් යයි.ඒ සඳහා සියළු පළාත් පාලන ආයතනවල සහාය දිය යුතුයි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx** ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව
**රට අර්බුධයට පත්ව ඇති අවස්ථාවේ යලි යථා තත්වයට පත්කර ගොඩනංවා සිටුවිම සඳහා අභිනවයෙන් පත්වූ ගරු ජනාධිපතිතුමාට හා ඉදිරියේ පිහිටුවීමට නියමිත සර්වපාක්ෂික ආණ්ඩුවට සියළු පළාත් පාලන ආයතනවල සහාය පල කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා

**05-03** කුරුවිට නගර සංවර්ධනයට අත්‍යාවශ්‍ය, කුරුවිට නගරය ආසන්නයේ පිහිටා ඇති දෙල්ගහඹිවිට ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය මගින් පවරාගැනීමට හා ඒ සඳහා සභා අරමුදලින් වැයබර දැරීම ට මහා සභා අනුමැතිය ලබාගැනීම සම්බන්ධ යෝජනාව.

කුරුවිට නගර සංවර්ධනයට අත්‍යාවශ්‍ය, කුරුවිට නගරය ආසන්නයේ පිහිටා ඇති දෙල්ගහඕවිට ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය මගින් පවරාගැනීමට හා ඒ සඳහා සභා අරමුදලින් වැයබර දැරීම ට මහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

එම යෝජනාව ස්ථිර කරමි.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා</u>

කුරුවිට නගර මධ්‍යයේ පිහිටි ,නගර සංවර්ධනයට අතිශය වැදගත් භූමිය මෙයයි.ව්‍යාපාරික ඉදිකිරීම් සඳහා මෙය ඉතා යෝග්‍යයි.නඩු තියෙනවා.එසේම විවිධ පුද්ගලයන් දැනටත් අනවසරයෙන් යම් යම් ඉදි කිරීම් කරනවා.මේ ඉඩම සභාවට පවරා ගැනීමට අපි නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ව දැනුවත් කලත් මිලියන 10 ක් තැන්පත් කිරීමෙන් පසුවයි ඒ පවරා ගැනීමේ කටයුතු ආරම්භ කල හැක්කේ. ඒක දන්වා තියෙනවා.මේ ඉඩම කෝටි 100 ටත් වඩා වටිනවා. ඒ හින්දා මේ ඉඩම කොහොම හරි සභා අරමුදලෙන් මිලියන 10 ක් සොයලා අපි පවරා ගමු.සිරිපා නිම්නයේ සුසැදි නවාතැන ලෙසින් මෙම නගරය සංවර්ධනය වෙද්දී කොළඹ සිට මේ නගරය පසු කරන් යන සංචාරකයා ඇත්තටම මෙහි නතර වෙලා යයි.මෙහි තියෙන සුන්දරත්වය ඓතිහාසික වටිනා කම සේම මේ නිස්කලංකත්වයට ඇත්තටම සංචාරකයා ආකර්ශනය වෙයි.එකවර නැතත් වාරික මගින් හෝ මේ මුදල බැඳීමට හැකිදැයි විමසන්න.මේ මුළු රටටම වටින ඉඩම අපේ සභාව සතු කරගන්නවාද කියලා තීරනය කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

ස්ථිරයි.නමුත් කරුනු කීපයක් තියෙනවා.දේලගහ ඕවිට ඉඩම සම්බන්ධව දිර්ග ඉතිහාසයක් තියෙනවා.නඩුවක් දිර්ඝව විභාග වෙනවා.ඒ නඩුව පෙර නිශ්ප්‍රභා උනා.ඒත් ගතයුතු ක්‍රියා මාර්ග ඒ වෙලාවේ ගත්ත නැති නිසා දැන් විශාල ගැටළු. පාඩු. සභාවට.කම්බි ගහලා මඩු හදනවා.ලිං මදනවා.ඇයි අපි මේ බලා ඉන්නේ.?පියරත්න මොඩල්ද?හදනකොට නිකං බලා ඉඳලා පස්සේ වියදම් කරලා උසාවි ගිහින් ඒක නීත්‍යාකූල කරලා බලපත්‍ර දෙනවා.අතේ හිටපු කුරුල්ලා ඉගිලිලා.ඒ වගේමයි.අර.ගොඩනැගිල්ලට එහා ලයිට් කනුවට එහා කඩේ දෙන්න එපා කීවට ඒක දිලා.ටෙන්ඩර් කරන්න කීවට කතා කරලා දිලා.ඒකත් පියරත්න මොඩල්.මේ සභාවේ අනවසර නඩු කියද? කියක් ඒ අනවසර ඒවා ඉවත් කරලා තියේද?මට විස්තර දෙන්න.
<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

ස්තිරයි.පැහැදිලිවම නගරයේ වටිනාම ඉඩම.අද තත්වය මම දන්නේ නෑ.නාගරික සංවර්ධන අධිකාරිය එහෙම කියනවා නම් පහු වෙනකොට මේ ඉඩමට තවත් විශාල වියදමක් දරන්න වෙයි. වටිනාකම 10 ගුනයකින් ඉහල යයි.2023 අයවැය යෝජනාවක් ලෙසත් මේතක මුඛ්‍ය කරුනක් ලෙස දාමු. මේ ඉඩම සංවර්ධනය.මේ කටයුත්ත නීත්‍යානුකූලව නිවැරදිව කරන්න.අනවසර ඉදිකිරීම ඉවත් කරන්න ලසු නොවන නඩුවකින් පුළුවන්.කා.නි වාර්තා අරන් යූ.ඩී. පනත

යටතේ පුළුවන්. නීතිඥ ගාස්තු අපරාදේ.මේක හොඳ ආයෝජනයක්.අපි සභාවේ නොසිටියත් මේ ඉඩම මේ අනාගතයට ඉතා වටිනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා

කිරිඇල්ලත් සංවර්ධනය කඩිනම් කරන්න.කිරිඇල්ල වැසිකිලියටවත් යන්න බෑ.අනවසර ඉදි කිරිම් .හිතනවා සර්ව පාක්ෂික ආණ්ඩුව වත් ඇවිල්ලා මේ රට දියුණු වෙයි කියලා.රනිල් ගරු ජනාධිපතිතුමාට සුභ පතනවා.එතුමාගේ කාලේ වත් කිරිඇල්ලට මුල් තැනක් දීලා සංවර්ධනය කරයි කියලා හිතනවා.වසර ගානක් ගියත් බස්තැවතුම තාම නෑ.අපිට උද්දාමයට පත් වෙන්න කිසිවක් වෙලා නෑ.රනිල් මැතිතුමාගේ කාලවෙත් හදමු.එදා මේක කලා සර්ව පාක්ෂික ආණ්ඩුව හැදුවා නම් ගෝඨාභය ගරු ජනාධිපතිතුමත් ඉන්නවා.එදා ඒක උනේ නෑ.මීට කලින් මේ සුභපැතුම් යෝජනාව මම දාන්න හැදුවත් එපා කීවා.අපේ කිරිඇල්ලටත් මේ සංවර්ධනය දෙන්න.රනිල් ගරු ජනාධිපතිතුමාට සුභ පතමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා

මේ කුරුවිට ක්‍රිඩා පිටිය දැන් ගැටළු නෑ. නමුත් තණකොල කපන මැෂිම තාම ගත්තේ නෑ.අද ඒවායේ මිලත් ඉහල ගිහින්.තනකොල උසට වැවිලා පේස්බුක් දායි මේවා.මුදල් තියේනම මේ මැෂිම ගේන්න.පෙට්‍රල් වලින් කපන්න රු. 80000.00 ක් විතර යනවා.ගේට්ටුට දැම්මට වැඩක් නෑ. ඒකට බහින්න බෑ. තනකොල.අපේ කාලෙන් පස්සේ වැඩක් නෑ.ගිය වසරේ සිට කියන්නේ.මාධ්‍ය ඉන්නවා.ඉතා ලැජ්ජයි. මේ තත්වය පිටිය ගැන පල වෙයි.කවුරුවත් විරුද්ධ වෙන්නෑ. මේකට මැෂිමක් ගේන්න.බොරු වැඩ ඕන තරම්.දැන් ස්පෝර්ට් මීට් තියයි. මේ යන්ත්‍රය ගේන්න.ටෙන්ඩර් නැතිව හරි ජල එකෙන් හරි ගේන්න. මොකද? අපි කාටවත් මේ තත්වය හොඳනෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජන් ප්‍රදීප් මහතා

අපි තීරනය කලානේ මේ මැෂිම ගේන්න.අත්‍යාවශ්‍ය දේ වෙලා නෑ.සිසීටිවීත් නෑ.කිරිඇල්ල වැසිකිලිය ලැජ්ජයි. කියන්නවත්.අනවසර ඉදිකිරීම්.ලොතරැයි කීපරුත් අල්ලගෙන.ආධාර අපතේ යනවා.නඩු පවරනවළු.ගරු කංචන ජයරත්න මැතිතුමාළු සභාපති. ඉතින් මේ කටයුතු කඩිනම් කරන්න.බැංකු ආධාරත් ගන්න.මේවා අත්‍යවශ්‍යයයි.තනකොල මැෂිමත් එහෙමයි.ලයිට් තාම දුන්නෙත් නෑ.මේ මාසේ හරි ඕනි ටික කරමු.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

මේ දෙල්ගහඔිවිට ඉඩම අත්‍යාවශ්‍යි.යූඩී එකට ගිය සඳුදා ගියා.ඒත් එකවර මුදල් බඳින්න ඕනිළු. මාස 06ක් තුල භුක්තිය දෙනවළු.පනත අනුව පවරා ගන්නවා නම් මේක කල යුතුමයි.දැන් ලක්ෂ 30 විතර ඩිපොසිට් තියෙනවා.ස්ථාවර එකේ එක්කෝටි අනූ දෙලක්ෂයක් විතර.මුද්දර ගාස්තු එන්න තියෙනවා.ආදායම් උපයන්න හැකි මේ ඉඩම ලබා ගැනීම අපේ යුතුකමක් හා වගකීමක්.ලක්ෂ 50 ක් සභාවේ ස්ථාවර තැන්පතු අරමුදලෙන් ලබා ගැනීමටත් ඉතිරි ලක්ෂ 50 ලැබෙන්න තියෙන උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් ලබා ගැනිමට වැඩපිළිවෙලක් හදමු.ඒ අඩු මුදල ලැබෙන ප්‍රතිපාදන වලින් ලබාගමු.මෙය සභා තීරණය ලෙස වාර්තාවේ ඇතුලත් කරන්න. ඉඩම පවරාගැනීමේ මේ කටයුතු නිම කරමු.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

මේවාට අමතරව උසාවි දඩ මුද්දර ගාස්තු ගැන සොයන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා
මුද්දර ගාස්තු කොපමන ලැබෙන්න තියේද?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා

සභා අරමුදල් වැය කල හැකිද?චක්‍රෙල්ඛය අනුව.කිරිඇල්ල වැඩත් කල හැකිද?

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

මේ කටයුත්ත කල යුතුම වැඩක්.ලක්ෂ දෙක ගානේ බෙදලා වැඩක් නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා
මේක කොට්ඨාශයේ වැඩක් නෙවෙයි. මේක බල ප්‍රෙද්ශයේ වැඩක්.

මේ අවස්ථාවේදි_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා ගරු සභාව දැනුවත් කර ප.ව. 12.55 ට අත්‍යවශ්‍ය කටයුත්තක් සඳහා මහා සභාවෙන් නික්මින.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා
අපි කිරිඇල්ලට අඩු සැලකිලි කලේ නෑ.සංවර්ධන කටයුතු කරලා තියෙනවා.කුරුවිට වරිපනම් ඒකක ගනන වැඩියි.බහුතර ජනතාවක් ඉන්නේ කුරුවිට.හිතනව කිරිඇල්ලත් සභාවක් විය යුතුයි කියලා. ඒත් අඩු සැලකිලි කලේ නෑ.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
දැන් වාද එපා.අද සභා යෝජනාවක් ලෙස දන්වන්න නිකුත් කැ ඇති චක්‍රලේඛනය අනුව සභා මුදල් වලටත් ඒ වාරනය වලංගුද කියලා අහන්න.සහකාර කොමසාරිස්,මගින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්ට අරින්න.ලබන බදාදා වන විට උත්තර ඕනි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා
තව මුද්‍ර ගාස්තු මාස 6 ක තියෙනවා එන්න. කෝටි 2ක් විතර.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා

අපිට වගේම අනිත් අයටත් දෙන්න සංවර්ධන මුදල්.අපි ගන්නකොට චක්‍ර ලේඛය නෑ. පසුව මාර්තු ආවේ.ඒ වගේම අපි ලඟ ඉන්න නිසා පහසුයි. මේ කිරිඇල්ල ඉදන් එනකොට ප්‍රමාදයි. කාර්මික නිලධාරීත් නෑ.අපි ලඟ නිසා කාර්මික නිලධාරීත් එක්ක ගිහින් වැඩ ටික කරගන්නවා.වීදි ලාම්පු දෙන්නේ කවදාද? ඒවා බෙදන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය.
අපි ඉල්ලුවත් ලැබුනේ නෑ.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

චක්‍ර ලේඛය ආවාට පස්සේ දුන්නේ නෑ.මන්ත්‍රීලා දෙන්නෙක් වැඩ කලා.කලින් .එසේම විදිලාම්පු ටිකත් සවි කරමු.ක්‍රීඩා පිටියට ලබන මාසේ ඇතුලත තණකොළ කපන යන්ත්‍රය ගේනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා

ඉතා සතුටුයි.මම හයිඩ්‍රාමනියෙන් අහන්න හිටියේ වැසිකිලිය ගැන වෙලාවක් අරන් කතා කරමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx**_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතාගේ යෝජනාව අනුව කුරුවිට නගර සංවර්ධනයට අත්‍යාවශ්‍ය, කුරුවිට නගරය ආසන්නයේ පිහිටා ඇති දෙල්ගහඕවිට ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය මගින් පවරාගැනීමට හා ඒ සඳහා ප්‍රතිදන ලක්ෂ 50 ක් සභාවේ ස්ථාවර තැන්පතු අරමුදලෙන් ලබා ගැනීමටත් ඉතිරි ලක්ෂ 50 ලැබෙන්න තියෙන උසාවි දඩ හා මුද්දර ගාස්තු ලෙස ප්‍රතිපාදන ලැබෙන අයුරින් සහා අරමුදලින් වැයබර දැරීම ට මහා සභා අනුමැතිය ලබාදීට ඒකමතිකව මහා සභා සම්මත විය.**Xxxxxxxxxxxxx**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා

**05-04.**දොඩම්පෙ,නාවල පිහිටි කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් ප්‍රජා ශාලාව පස් කන්දක් හේතුවෙන් අනතුරට පත්වෙමින් පවතින බැවින් එම අනතුරුදායක තත්වය ඉවත්කරගැනීමට සභාවේ මැදිහත්විම ලබාගැනීම සම්බන්ධ යෝජනාව.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා

දොඩම්පෙ,නාවල පිහිටි කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් ප්‍රජා ශාලාව පස් කන්දක් හේතුවෙන් අනතුරට පත්වෙමින් පවතින බැවින් එම අනතුරුදායක තත්වය ඉවත්කරගැනීමට සභාවේ මැදිහත්විම ලබාගැනීම සඳහා ඉදිරිපත් කරමි.
දොඩම්පෙ,නාවල පිහිටි කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් ප්‍රජා ශාලාව පස් කන්දක් හේතුවෙන් අනතුරට පත්වෙමින් පවතින බැවින් එම අනතුරුදායක තත්වය ඉවත්කරගැනීමට සභාවේ දායකත්වය ලෙස බැකෝ යන්ත්‍රය යොදා පස්ඉවත්කර දෙන ලෙස යෝජනා කරමි.
අසල පෙරපාසැලක්ද වේ.ගමේ ඉල්ලීමකි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී මාලනී පීරිස් මිය
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා
කාර්මික නිලධාරි වාර්තා අරන් සුදුසු ක්‍රමවේදයක් අනුව අනතුරුදායක තත්වය ඉවත්කරගැනීමට කටයුතු කරමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx** **<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන</u> මහතා ගේ යෝජනාව අනුව දොඩම්පෙ,නාවල පිහිටි කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් ප්‍රජා ශාලාව පස් කන්දක් හේතුවෙන් අනතුරට පත්වෙමින් පවතින බැවින් එම අනතුරුදායක තත්වය ඉවත්කරගැනීමට සභාවේ දායකත්වය ලෙස බැකෝ යන්ත්‍රය යොදා පස්ඉවත්කර ගැනිමට හෝ කාර්මික නිලධාරිවාර්තා අනුව සුදුසු ක්‍රමවේදයක් යෙදිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දිම යුරේශ් පතිරන මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>

**05-05.** **පශ්චාත් කොවිඩ් රෝගය යටතෙන් පසු පාසැල් හැරගිය දරුවන් නැවත අධ්‍යාපනයට නැඹුරු කිරීමේ ක්‍රියා කලාපයක් හා අධ්‍යාපනය සම්බන්ධව සිසු ගුරුවරුන්ට ඇති බාධා පිලිබඳව අදාල නිලධාරින් දැනුවත් කිරිම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දිම යුරේශ් පතිරන මහතා</u>

**පශ්චාත් කොවිඩ් රෝගය යටතෙන් පසු පාසැල් හැරගිය දරුවන් නැවත අධ්‍යාපනයට නැඹුරු කිරීමේ ක්‍රියා කලාපයක් හා අධ්‍යාපනය සම්බන්ධව සිසු ගුරුවරුන්ට ඇති බාධා පිලිබඳව අදාල නිලධාරින් දැනුවත් කිරිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දිම යුරේශ් පතිරන මහතා</u>
අපි සභාවක් ලෙස බලධාරින්ව දැනුවත් කරමු.
කොවිඩ් නිසා වසර 3ක් විතර පාසැල් තිබුනේ නෑ.පළාත් සහා පාසැල් වලට ලමයි යාම අඩුවෙලා.පන්තිවල ලමයි අඩුයි.දෙමව්පියන්ට කීවාම කියන්නේ ලමයි කැමති නෑළු. දැයට අනාගත ප්‍රශ්නයක් වෙලා.උසස්පෙල පන්තිවලත් අඩුයි.මේ රටේ හිටියොත් කාලකන්නි වෙනවා කියලා තවත් මතයක්.ඒ අයත් ශ්‍රම බලකායටම එකතු වෙලා. 2007 වසරේ 13 වසර අඛන්ඩ පාසැල් අධ්‍යාපනය තියෙන්නේ සීවලියේ විතරයි. පාසැල් වලින් බැහැර වෙලා.කොවිඩ් වලින් පස්සේ මේවා උනේ.සමහර පාසැල් වල 13 වසරට ලමයි නෑ.ඔන්ලයින් නිසා සමහර අවුරුදු 13,14 වයස්වල ලමයි ප්‍රේම සබඳතාත් පටන් අරන්.අධාපන රටාව පිරිහිලා.සමහර ළමයි ගණිකා නිවාසවල. මත්ද්‍රව්‍ය ගැනිමට අඩු වයස්වල සිසුන් පවා පෙළඹිලා.සංස්කෘතිය පිරිහිලා. ඇතැම් පාසැල්වලට සිසුන්,ගුරුවරුන් යනකොට ප්‍රමාදයි.ප්‍රවාහන සේවා අඩාල නිසා. නාමලේඛනය ලකුනු කරනකොටත් ගැටළු.
**සමහර ලමයින්ට උදේට ආහාරයක්වත් නැතිව එන්නේ. දෙමාපියන්ට ස්ථිර තියා මොන ආදායමක්වත් නෑ. කේතුමතී දහම්පාසැලේ උදේට කැඳ දෙනවා.දෙමාපියන් එකතු වෙලා.එළඹ තියෙන්නේ අඳුරු කාල රාමුවක්. කන්න බොන්න දෙයක් නැත්නම් මොකද කරන්නේ?**
**ගුරුවරුන්ටත් මානසික පීඩා. දුර බස්රථ සේවා නෑ.සමහර පාසැල් වහලා.ලමයි පාපැදිවලිනුත් අනතුරු කරගෙන ජීවිතයත් අහිමි වෙලා.**

**1 වසර 5 වසර වැඩපොත්නෑ. සමහර පාසැල්වල.හාප්ෂීට් මිල ඉහල ගිහින්. අභ්‍යාස පොත් මිලත් ඉතා වැඩියි. විකල්ප තියේද මන්දා.සමහරුන්ට භූගෝලය අච්චුපොත හම්බුවෙලා නෑ.කාටද කියන්නේ? නිදහස් අධ්‍යාපනය කීවට ටියුෂන් මාස්ටර්ස්ලා ලමයින්ව මරාගෙන කනවා වගෙයි. අදාල අංශ දැන්වත් කරන්න.**

__ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා__

**අධ්‍යාපන ඇමතිතුමා ව ත් මේගැන සොයා බලා දැනුවත්කරමු.**

__ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා__

**දැන් ඉන්නේ බහුතරයක් ගුරුවරු නෙවේ.අපි නිදහස් අධ්‍යාපනයෙන් ඉගෙන ගත්තා.සාපෙ,උපෙ කලා.ටියුෂන් නෑ. දැන් ඔන්ලයින් කලත් විදුලිය කපලා.ස්ට්‍රයික්කලා.අසාධාරන ගුරුවරු වර්ජනය කලා.වෘත්තිය ගෞරවය නැති කරනවා.හොඳම දේ ගුරුවරුන්ට ලඟම පාසැල දෙන්න ඕනි.පත්වීම් දෙන්නඕනි ගමට.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx __ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දිම යුරේශ් පතිරන__ මහතා ගේ යෝජනාව අනුව පශ්චාත් කොවිඩ් රෝගය යටතෙන් පසු පාසැල් හැරගිය දරුවන් නැවත අධ්‍යාපනයට නැඹුරු කිරීමේ ක්‍රියා කලාපයක් හා අධ්‍යාපනය සම්බන්ධව සිසු ගුරුවරුන්ට ඇති බාධා පිලිබඳව ගරු අධ්‍යාපන ඇමතිතුමා ඇතුළු අදාල අංශ නිලධාරින් දැනුවත් කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-06 සීඝ්‍ර ලෙස ව්‍යාප්ත වන ඩෙංගු රෝගයට පිලියම් ලෙස ස්ථිර වැඩ පිලිවෙලක් ප්‍රදේශයේ ජනතාවට ලබා දිම සම්බන්ධ යෝජනාව.**

__ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දිම යුරේශ් පතිරන මහතා__
**සීඝ්‍ර ලෙස ව්‍යාප්ත වන ඩෙංගු රෝගයට පිලියම් ලෙස ඩෙංගු පිටුදැකීමට ස්ථිර වැඩ පිලිවෙලක් ප්‍රදේශයේ ජනතාවට ලබා දීමට යෝජනා කරමි.**
__ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා__
__එම යෝජනාව ස්ථිර කරමි.__
__ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දිම යුරේශ් පතිරන මහතා__
ඩෙංගු රෝගය කලාප කිපයක දැඩිව තියෙනවා.ඒවා අවධානම් කලාප.2021ට සාපේක්ෂව මේ වසරේ ඩෙංගු අවධානම වැඩියි.අපේ සභාවෙන් අපි මේ සඳහා සුදුසු ස්ථිර විසඳුමක් දීමට කටයුතු කල යුතුයි.ඒ සඳහා අවශ්‍ය සියළු අංශ වල සහාය ලබා ගත යුතුයි.

__ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන මහතා__
මගේ කොට්ඨාශෙත් බහුලයි. මේ ගැටළුව.ආසන්න දිනකදි මට මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාත් කතා කලා.පෙර සභාවෙන් ධූමායනය කලා.නමුත් දැන් ඒ සඳහා

පහසුකම් නෑ කීවා.මම හිතන්නේ එය සභාවෙන් සිදු කිරිම මේ මර්ධන කටයුතු සඳහා සුදුසු ක්‍රමයක්.රෝගීන් අඩු වෙනවා.මේ වෙනකොට අපිට සභාවෙන් එම කටයුත්ත කල නොහැකිද?

<u>ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

ඩිසල් 50 ක්  ,වගේ ද්‍රව්‍ය වගයක් ඉල්ලන්නේ.ඒ ගාස්තු ඉහලයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  මංගල ඩයස් මහතා</u>

පසු විපරම් වැටලීම් කලාට ඒවායේ ප්‍රතිපල බැලිය යුතුයි.මහජනතාවත් තමන්ගේ ගෙවත්ත පිරිසිදුව තබාගත යුතුයි.ඒකයි පලමු කොට කල යුත්තේ.සජීවිකරනය විය යුතුයි.වැඩමුළු තියලා දැන්වත් කල යුතුයි.මේවා  මේතත්වය ඒමට පෙර කල යුතුයි. කලට වේලාවට ඒ අවශ්‍ය දේවල් කල යුතුයි.නමුත් ඒවා වෙන්නේ නෑ.වියදම් කලාට විතරක් බෑ.කසලත් නිසි පරිදි කලමනා කරනය විය යුතුයි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

අපි ,ප්‍රාදේශීය ලේකම්,සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි, මහජන සෞඛ්‍ය පරීක්ෂක ආදී අවශ්‍ය අංශ එකතු වෙලා ඒකාබද්ධ වැඩපිලිවෙලක් හදන්න ඕනි.බෝපත් ඇල්ල වගේ පොදු ස්ථාන වල බිලා නටලා බෝතල් කුඩුරලා කැලි හැමතැනම.එල්ලාවල පාසැල අසල කානුපද්ධතිය ලක්ෂ 16 වැය කරලා හැදුවත් ඒකත් මිනිස්සු අවහිර කරලා.ඒක ඇරියෙතේ මේ කානුවේ වතුර රැස්වෙලා මදුරුවෝ බෝවෙන එක නවතිනවා.මේ ඩෙංගු බෝකරන වැඩ වලට නඩු දාන්න ඕනි.ඒක තමා නිවැරදි ක්‍රමය නීතිය.විශේෂයෙන් මේ අවස්ථාවේ පොදු ස්ථානවල කසල කලමනාකරනය කරලා දැනුවත් කිරිම් කරන්න ඕනි. විවිධ ක්‍රමවේද භාවිතා කරලා ඩෙංගු පිටුදකින්න ඕනි. ඒසඳහා ආයතන වශයෙන් ගත යුතු ක්‍රියාමාර්ග ගන්න ඕනි.ජනතාව ගලා බසින ඇලට කසල දාලා.ගෙවල් වල කසල කානුවල.මහජන සෞඛ්‍ය පරීක්ෂක,පවුල් සෞඛ්‍ය සේවා නිලධාරී, ග්‍රාම සේවක,ආර්ථික සංවර්ධන නිලධාරී,වගේ නිලධාරින් එකතු කරලා මේවට විධිමත් කටයුතු සැලසුම් කරලා ක්‍රියාත්මක කරන්න.නමුත් මේතරම් නිලධාරි හිටියත් ගුනාත්මකව සේවයක් විය යුතුයි. කියුබාවේ ඩෙංගු නෑ.මදුරුවෝ නෑ. ඒ අය ජය අරන්.අපිම  පරිසරයට කරන විනාශයයි මේ අපිට පල දෙන්නේ. තෙල් දුන්නට විතරක් බෑ. අපි ගම්වල කමිටු කැඳවලා පොදුව මේ ගැටළුවට පිලියම් යොදන්න ඕනි.

<u>ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**මේ විශේෂයෙන් ඩෙංගු සම්බන්ධ ගැටළු තියෙන ස්ථානවල සියළු දෙනා දැනුවත් කරලා විශේෂ විසදුම් වැඩපිලිවෙලකට යමු. ක්‍රමවේදයක් හදමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  චන්දිම යුරේශ් පතිරන</u> මහතා ගේ යෝජනාව අනුව සීඝ්‍ර ලෙස ව්‍යාප්ත වන ඩෙංගු රෝගයට පිලියම් ලෙස  ඩෙංගු පිටුදැකීමට ස්ථිර වැඩ**

**පිලිවෙලක් ප්‍රදේශයේ ජනතාවට ලබා දීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජනක විමලසිරි මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>

**05- 07.කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් හරක් මස් කඩයේ මස් මිලදී ගැනීමේදී පාරිභෝගිකයාට සිදුවන අසාධාරනය වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ගයක් ගැනීම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජනක විමලසිරි මහතා</u>
මාගේ යෝජනාව සම්බන්ධව තව දුරටත් නිවැරදි දත්ත ලබාගෙන ඉදිරි සභාවාරයට ඉදිරිපත්කරන බව ගරු මන්ත්‍රිතුමා විසින් දැනුම් දුන් අතර ගරු සභාපතිතුමා විසින් ද ඒ අනුව කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදි.

2022.08.12 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක **05-08** සභා උද්ධෘතය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද විජේකුමාර මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා

**05- 08.**බටතොට මහවත්තකන්ද මාර්ගයේ බටතොට පාලමේ ඇදිදෙක අළුතෙන් සවිකිරිම සම්බන්ධ යෝජනාව

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද විජේකුමාර මහතා
**බටතොට මහවත්තකන්ද මාර්ගයේ බටතොට පාලමේ ඇදිදෙක අළුතෙන් සවිකිරිමට යෝජනා කරමි.**
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය.**
එම යෝජනාව ස්ථිර කරමි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද විජේකුමාර මහතා
**මීට සති දෙකකට පෙර මේ ස්ථානයෙන් මහවත්තකන්ද බස්රථයේ කොන්දොස්තර මහතා රාත්‍රියේ එද්දි පාලමෙන් පහලට වාටිලා මැරිලා. මේ ස්ථානය ඇදි නැතිව දැඩි අවධානමක තියෙන්නේ.ඊට පෙරත් 6 දෙනෙක් වැටිලා.4 ක් පීනලා බේරිලා.මේ කටයුත්ත කඩිනමින් ඉටු කර දෙන්න.**
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා

**වටිනා ජීවිතයක් වතුරේ ගියා.මීට පෙර ත් ජීවිත අවධානම් මේ ස්ථානයෙදි උනා.දැඩි අනාරක්ෂිතයි.කුමන මුදලකින් හෝ මේ අවධානම ඉවත්කර හදලා දෙන්න.එරත්නෙ පොඩිපාලමත් ගංවතුරට අසුවෙලා ගසාගෙන ගිහින්.ඒක අඩි 06 ක විතර පාලමක්.පාසැල් ලමුන් යනවා. .ගංවතුරට යකඩ ගහගෙන ගිහින්.ඒකත් හැකි ලෙස සකසන්න.අපිට සභාවක් ලෙස කලහැකි දෙයක් කරලා ජනතාවගේ ජීවිත ආරක්ෂාව ලබා දෙන්න.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා
**කාර්මික නිලධාරි වාර්තා අරන් මේ සම්බන්ධව අවශ්‍ය අංශ දැනුවත්කරමු.විධායක ඉංජිනේරු හා ආපදා ඒකකයටත් දැනුම්දෙමු.**
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය
**Xxxxxxxxxxxxxx**_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද විජේකුමාර මහතාගේ යෝජනාව අනුව බටතොට මහවත්තකන්ද මාර්ගයේ බටතොට පාලමේ ඇදිදෙක අළුතෙන් සවිකර ජනතාවගේ ජීවිත අවධානම ඉවත්කිරිම සඳහා කාර්මික නිලධාරි වාර්තා ලබාගෙන විධායක

**ඉංජිනේරු,ආපදා ඒකකය හා අදාල අංශ වෙත දැනුම් දීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

2022.08.12 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-08 සභා උද්‍ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්. වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

2022.08.12 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-09 සභා උද්‍ධෘතය**

**05-09. සූදාගල ඇළ හරහා ඇති පාලම ගංවතුරට හසුවී කැඩී ඇති හෙයින් සංවර්ධනය කිරිම සම්බන්ධ යෝජනාව.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද විජේකුමාර මහතා**

**සූදාගල ඇළ හරහා ඇති පාලම ගංවතුරට හසුවී කැඩී ඇති හෙයින් සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද විජේකුමාර මහතා**

**සූදාගල ඇළ හරහා ඇති පාලම ගංවතුරට හසුවී කැඩී ඇති හෙයින් සංවර්ධනය කිරිම අත්‍යවශයි.මේක අනතුරුදායකයි.ඉවුරත් එක්ක ගලවගෙන ගිහින්.දළු ලොරි එන්නත් බෑ.ප්‍රාදේශිය ලේකම්ටත් කීවා.තාම නෑ.ආපදා අංශයේ මුදලුත් නෑ කීවා.වාහනයක්වත් ගමන් කරන්න බෑ.මැදිහත්වෙලා කරදෙන්න.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධනංජය වීරසේකර මහතා**

**පොහොරබාව ග්‍රාමනිලධාරිකාර්යාලය අසලත් මාර්ගයේ කාපට් කරපු ස්ථානය ඇලකන්ඩිය මාර්ගය ලඟටම ඇවිත්.වැස්ස නිසා සෝදාපාළුවෙලා මාර්ගය අවධානමේ.විධායක ඉංජිනේරු කාර්යාලයට දැනුම් දීලා පිලිසකර කර දෙන්න.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

**සූදාගල ඇළ හරහා ඇති පාලම ගංවතුරට හසුවී කැඩී ඇති හෙයින් මෙම යෝජනාව සම්බන්ධවත් කාර්මික නිලධාරි වාර්තා අරන් මේ සම්බන්ධව අවශ්‍ය අංශ දැනුවත්කරමු.විධායක ඉංජිනේරු හා ආපදා ඒකකයටත් දැනුම්දෙමු._ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධනංජය වීරසේකර මහතා දැනුම්දුන් කරුන පිලිබදවත් වාර්තා අරන් අදාල අංශ වලට වාර්තා කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද විජේකුමාර මහතාගේ යෝජනාව අනුව සූදාගල ඇළ හරහා ඇති පාලම ගංවතුරට හසුවී කැඩී ඇති හෙයින් සංවර්ධනය කිරිම සඳහා**

කාර්මික නිලධාරි වාර්තා ලබාගෙන විධායක ඉංජිනේරු,ආපදා ඒකකය හා අදාල අංශ වෙත දැනුම් දීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx

**05-10.කුරුවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට අයත් කුඩා ජල විදුලි බලාගාර ,සභාව සමග ගිවිසුම්ගත විම හා එසේ ගිවිසුම් ගත නොවුන බලාගාර පිලිබඳව මහා සභා තීරනයක් ලබාගැනීම සම්බන්ධ යෝජනාව**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**කුරුවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට අයත් කුඩා ජල විදුලි බලාගාර ,සභාව සමග ගිවිසුම්ගත විම හා එසේ ගිවිසුම් ගත නොවුන බලාගාර පිලිබඳව මහා සභා තීරනයක් ලබාගැනීම ට අවශ්‍යයි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

එකඟතා ගිවිසුමකට එළඹිය යුතුයි.මුලදිම මම යෝජනා කලා.නමුත් කලේ නෑ. අනිත් බලපත්‍ර දීලා.ගිවිසුමක් ගහන්න ඕනි.අපිට දෙන ගාන ගන්න කීවා.ඒ කටයුතු කරලා නෑ. ආදායම් නිලධාරී මේ සභාවේ ආදායම් පිලිබද සොයා බලන්න ඕනි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

තෙබුවන එකට අපි ගත්තා.ගිවිසුම් හැදුවා.ගෙවලා නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද විජේ කුමාර මහතා

මම කීවා මේ සම්බන්ධව. මුදල් ගන්න කියලා.බලාගාර 4ක් තියෙනවා.වර්ණගල තව ගොඩනැගිලි හදනවා.මෙහෙන් අවසර අරගෙනද?අවසර නැතුව කරලා.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

මෙහාට සැලසුම ඉදිරිපත්කලාමයි අනුමත කරන්නේ.ලෝන් වලට අනුමැතිය ඕනි නිසා එනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

මුල් අවස්ථාවේ අනුමැතිය දීමේදි එකඟතා ගත යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

මේ සම්බන්ධව දැන් කටයුතු කරන්න.සභාවේ නීති කටයුතු කරන නීතිඥයා ලවා විධිමත් ගිවිසුම හදලා සභාවට පෙන්වන්න.අනුමැතිය ගන්න. එසේම ඒ සියළු විදුලිබලාගාර හිමියන් සභාවට ගෙන්වලා දැනුවත්කරලා මේ ගිවිසුම් වලට අත්සන් ගන්න.සියළු බලාගාර හිමියන් ගිවිසුම් ගත විය යුතුයි. නැත්නම් නීතිමය පියවර ගන්න.ලබන සභාවට පෙර මේ පිලිබද යම් ප්‍රගතියක් තිබිය යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

මේක බයිලෝ වල නෑ.පලාත් සභා ප්‍රඥප්තිඅනුව කල යුතු වන්නේ.

ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා

ඒ අනුව කුරුවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට අයත් **කුඩා ජල විදුලි බලාගාර ගිවිසුම්ගත කරවිම සම්බන්ධව කටයුතු කිරිම සදහා විධිමත් ගිවිසුමක් නීතිඥ මහතා මගින් සකසාගැනිමටත් බල ප්‍රදේශයේ  සියළු** විදුලිබලාගාර හිමියන් දැනුවත් කර  සභාව සමග ගිවිසුම් ගත කර ඉදිරි කටයුතු කිරිමටත් ගිවිසුම්ගත නොවන බලාගාර සම්බන්ධව නීතිමය පියවරගැනිමටත් යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx_**ගරු ප්‍රාදේශීය සභා ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට අයත් **කුඩා ජල විදුලි බලාගාර ගිවිසුම්ගත කරවිම සම්බන්ධව කටයුතු කිරිම සදහා විධිමත් ගිවිසුමක් නීතිඥ මහතා මගින් සකසාගැනිමටත් බල ප්‍රදේශයේ  සියළු** විදුලිබලාගාර හිමියන් දැනුවත් කර ගිවිසුම් ගත කර ඉදිරි කටයුතු කිරිමටත් ගිවිසුම්ගත නොවන බලාගාර සම්බන්ධව නීතිමය පියවරගැනිමටත් **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05-11 කුරුවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන සන්නිවේදන කුළුණු , සභාව සමග ගිවිසුම්ගත විම හා එසේ ගිවිසුම් ගත නොවුණු  සන්නිවේදන කුළුණු පිලිබදව මහා සභා තීරනයක් ලබාගැනීම සම්බන්ධ යෝජනාව**

ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා

**කුරුවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන සන්නිවේදන කුළුණු , සභාව සමග ගිවිසුම්ගත විම හා එසේ ගිවිසුම් ගත නොවුණු  සන්නිවේදන කුළුණු පිලිබදව මහා සභා තීරනයක් ලබාගැනීම අවශ්‍ය වේ.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

මේ කුළුනු ගැන ගැටළු මීට පෙරත් කතා කලා.නිශ්චිත තැනක් නැතිව අනුමැතිය දීලා. ඒ හදලා තියෙන කුළුණු වලට මුල සිටම යම් නිශ්චිත ගාස්තුව අය කරලා නීත්‍යානුකූලව කටයුතු කල යුතුව තිබුනා.ගුණවර්ධන සභාපතිතුමා පුද්ගලිකව

දුන්න කුළුන හදපු තැනට තාමත් ආදායමක් එනවා.කිරිඇල්ල දලා.නඩුකාරදෙනිය හදලා .මේවත් පියරත්න මොඩල්.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
මේ කුළුණු සම්බන්ධවත් අර විදුලිබලාගාර ලෙසටම කටයුතු කරමු.එය සුදුසුයි.
ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා
තියෙන ගැටළු විසඳගන්න තමයි මේ යෝජනාව ඉදිරිපත් කලේ.ගරු උප සභාපතිතුමා කී ලෙස මෙම කටයුත්ත සිදුකිරිම යෝග්‍ය වේ.

ඒ අනුව කුරුවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට අයත් **සන්නිවේදන කුළුණු ගිවිසුම්ගත කරවිම සම්බන්ධව කටයුතු කිරිම සදහා විධිමත් ගිවිසුමක් නීතිඥ මහතා මගින් සකසාගැනිමටත් බල ප්‍රදේශයේ සියළු සන්නිවේදන කුළුණු** හිමියන් දැනු වත් කර සභාව සමග ගිවිසුම් ගත කර ඉදිරි කටයුතු කිරිමටත් ගිවිසුම්ගත නොවන **සන්නිවේදන කුළුණු** සම්බන්ධව නීතිමය පියවරගැනිමටත් යෝජනා කරමි.
ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
**එම යෝජනාව ස්ථිර කරමි.**
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

Xxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට අයත් **සන්නිවේදන කුළුණු ගිවිසුම්ගත කරවිම සම්බන්ධව කටයුතු කිරිම සදහා විධිමත් ගිවිසුමක් නීතිඥ මහතා මගින් සකසාගැනිමටත් බල ප්‍රදේශයේ සියළු සන්නිවේදන කුළුණු** හිමියන් දැනු වත් කර සභාව සමග ගිවිසුම් ගත කර ඉදිරි කටයුතු කිරිමටත් ගිවිසුම්ගත නොවන **සන්නිවේදන කුළුණු** සම්බන්ධව නීතිමය පියවරගැනිමටත් **ඒකමතිකව මහා සභා සම්මත විය.**Xxxxxxxxxxxxxx

**05-12 2006 අංක 35 දරණ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ 4 (අ) 1 වගන්තිය යටතේ කුරුවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට අයත් ඇළ රක්ෂිත ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධ යෝජනාව.**
ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා
**2006 අංක 35 දරණ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ 4 (අ) 1 වගන්තිය යටතේ සබරගමු පළාතේ සියළු ඇළ රක්ෂිත ප්‍රදේශ බවට ප්‍රකාශයට පත් කිරීම වෙරල සංරක්ෂන හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මගින් සිදු කෙරෙන අතර ඒ සම්බන්ධව මෙම පළාත් පාලන ආයතනය වෙතද වෙරල සංරක්ෂන හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ වන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව මගින් දැනුවත් කර ඇත.ඒ අනුව මෙම කටයුත්ත කඩිනමින් සිදු කිරිම සදහා සදහා සියළු පළාත් පාලන ආයතන වල එකගත්වය ලබාදිය යුතුව ඇත.පළාතේ සියළු ප්‍රධාන ඇල මාර්ග,සියළු අතුරු ඇළ මාර්ග හා සියළු පෝෂිත ඇළ මාර්ගයන්හි මතුපිට පළළ අනුරූප වන සේ**
උපලේඛනය මගින් දුර ප්‍රමාණ දක්වා ඇත. අදාල උප ලේඛනය සභාගත කරමි.ඒ අනුව**2006 අංක 35 දරණ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ 4 (අ) 1 වගන්තිය යටතේ හා එම උපලේඛනයේ සදහන් දුර ප්‍රමාණ අනුව කුරුවිට ප්‍රාදේශිය සභා බල**

**ප්‍රදේශයට අයත්** ඇළ රක්ෂිත ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධව මහා සභා අනුමැතිය ලබා දිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>**

වලදුර නාන තොටුපල අයත් ඇළද මීට ඇතුලත් විය යුතුයි.අපෙන් විස්තර ගත යුතුයි.අපේ සභා අනුමැතිය දෙන්න නම් දැනුවත් කර විස්තර ලබා දිය යුතුයි.වෙන ඒවා ඇතුලත් කරයි. තොටුපල අයත් ඇළ රක්ෂිතයද ඇතුලත් විය යුතුයි.පූර්ව අනුමැතියක් ගත යුතුයි.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>**

මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමටයි එවා තියෙන්නේ.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව** 2006 අංක 35 දරණ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ 4 (අ) 1 වගන්තිය යටතේ **හා** එම උපලේඛනයේ සදහන් දුර ප්‍රමාණ අනුව **කුරුවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට අයත්** ඇළ රක්ෂිත ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධ **ව** මහා සභා අනුමැතිය ලබා දිමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

2022.08.12 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක **05-13 සභා උද්‍ඝතය**

**05-13.තිරිවාන,පරකඩුව 'අපි සුභ සාධක සමිතියට හට් එකක් හා පුටු 25 ක් ලබා දීම සම්බන්ධ යෝජනාව**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

**තිරිවාන,පරකඩුව 'අපි සුභ සාධක සමිතියට හට් එකක් හා පුටු 25 ක් ලබාදෙන ලෙස සමිතියේ ලේකම් විසින් ඉල්ලීමක් සිදුකර ඇත. ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන ,ප්‍රතිපාදන ලැබෙන අයුරින් තිරිවාන,පරකඩුව 'අපි සුභ සාධක සමිතියට හට් එකක් හා පුටු 25 ක් ලබා දීමට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා**

මුදල් තියේද? මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිපාදන ලබාගැනිමට ක්‍රමයක් හදන්න.අපෙත් යෝජනා ක්‍රියාත්මක කල යුතුව ඇත.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව හා අපි සුභසාධක සමිතියේ ඉල්ලීම අනුව, ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන ,ප්‍රතිපාදන ලැබෙන අයුරින් තිරිවාන,පරකඩුව 'අපි සුභ සාධක සමිතියට හට් එකක් හා පුටු 25 ක් ලබා දීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05-14.**කුරුවිට නගරයේ මහජන වැසිකිලියේ නඩත්තු කටයුතු සිදු කිරිම සම්බන්ධ යෝජනාව

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

කුරුවිට නගරයේ මහජන වැසිකිලියේ නඩත්තු කටයුතු සිදු කිරිම සම්බන්ධව තලාවිටිය,පරකඩුව , ඩබ්.පියරත්න,මයා විසින් ඉල්ලීමක් සිදුකර ඇත.ඒ අනුව මෙම ප්‍රාදේශිය සභාවට අයත් කුරුවිට නගරයේ මහජන වැසිකිලියේ පිරිසිදු කටයුතු කරමින් නඩත්තු කර පවත්වාගෙන යාමට අනුමැතිය ඉල්ලා ඇති අතර දෛනිකව රු.300.00 බැගින් සභාවට අයකර තලාවිටිය,පරකඩුව , ඩබ්.පියරත්න,මයා හට කුරුවිට මහජන වැසිකිලියේ පිරිසිදු හා නඩත්තු කටයුතු සිදු කිරිමට, ගිවිසුම් ගතව පැවරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
එම යෝජනාව ස්ථිර කරමි.
ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

දැනට කරන්නේ සභාවේ වැඩ කරන අයෙක්.නමුත් ඉන්න කෙනාට වැටුප ගෙවන්නේ දිනකට. ඒ නිසා එතන ගැටළුවක්.දෙකකට ගෙවන්න බෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

ඒ වැසිකිලියේ තින්ත ගාලා, බට දාලා ,දොරවල් දාන්න.හරියට.මම කලින් ඉල්ලුවා මම කරන්න.සුළු වියදමක් අතින් දරලා. නමුත් මට ඒකට ලිඛිත අවසරයක් දුන්නේ නෑ.දැන් නම් විශාල වියදමක් යයි.ඇත්තටම මේ වැසිකිලියේ තත්වය සම්බන්ධව ලැජ්ජාවට පත්විය යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
මංගල මන්ත්‍රිතුමාට ඒ අවසරය දෙන්න.පියරත්නත් ටික දවසක් යනකොට කියයි මේක රෙපෙයාර් කරලා දෙන්න කියලා.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

කාර්මික නිලධාරී වාර්තා අරගෙන මේ කටයුත්ත කඩිනමින් සිදු කරන්න.රු. 25000.00 ක විතර ඇස්මේන්න්තුවක් යයි.මංගල මන්ත්‍රි තුමාට අපි එපා කීවේ නෑ මේ කටයුත්ත සිදු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

ලිඛිතව දුන්නේ නෑ.එසේ නොමැතිව කටයුතු කිරීමෙන් ගැටළු ඇති විය හැකියි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx** ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව හා තලාවිටිය,පරකඩුව , ඩබ්.පියරත්න,මයා විසින් සිදුකර ඇති ඉල්ලීම අනුව කුරුවිට නගරයේ මහජන වැසිකිලියේ දෛනික පවිත්‍රතා හා නඩත්තු කටයුතු ඩබ්.පියරත්න,මයා හට ගිවිසුම් ගතව පැවරීමටත් ඒ වෙනුවෙන් දෛනිකව රු.300.00 බැගින් සභාව වෙත අයකරගැනීමටත් **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05- 15.සෞඛ්‍ය කම්කරු එස්. පී. අනෝමා මියගේ සේවා ගිවිසුම් කාලය දීර්ඝ කර ගැනීම හා සේවා ගිවිසුම අළුත් කිරීම සම්බන්ධ යෝජනාව.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

සෞඛ්‍ය කම්කරු එස්. පී. අනෝමා මියගේ මාස 06 ක සේවා ගිවිසුම් කාලය2022.09.01 දිනෙන් අවසන් වේ.ඒ අනුව මෙම සේවිකාව මෙම සභාවේ කසල ප්‍රතිචක්‍රීකරන කටයුතු සඳහා යොදවා ගැනීම තව දුරටත් අත්‍යාවශ්‍ය වන බැවින් 2022.09.01 දින සිට ඉදිරි මාස 06ක කාලයකට සේවා කාලය දිර්ඝ කිරීමටත් , පළාත් පාලන කොමසාරිස් අනුමැතිය ලද පසු මාස 06 ක සේවා කාලයකට සේවා ගිවිසුම් අළුත් කර නීත්‍යාණුකූලව මෙම සභාවෙන් වැටුප් ගෙවීමටත් යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

**එම යෝජනාව ස්ථිර කරමි.මෙම සේවය වසරින් වසර වන සේ දීර්ඝ කල හැකිද? මෙම සේවිකාවගේ සේවය අත්‍යාවශ්‍ය බැවින් .**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**චක්‍රෙල්ඛය අනුව වසරක් කල නොහැක.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx** ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව මෙම සභාවේ සෞඛ්‍ය කම්කරු එස්. පී. අනෝමා මියගේ සේවා කාලය 2022.09.01 දින සිට ඉදිරි මාස 06 ක කාලයකට දිර්ඝ කිරීමටත් , පළාත් පාලන කොමසාරිස් අනුමැතිය ලද පසු මාස 06 ක සේවා කාලයකට සේවා ගිවිසුම් අළුත් කර මෙම නීත්‍යාණුකූලව සභාවෙන් වැටුප් ගෙවීමටත් **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05- 16.සමාධි පෙදෙස පාර, මිල්ලවිටිය, කුරුවිට පදිංචි එම්.පී. අශෝකා රංජනි මිය විසින් බදු මුදල් ගෙවීම අපහසු බව දන්වමින් යොමුකර ඇති ඉල්ලීම සම්බන්ධ යෝජනාව**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

සමාධි පෙදෙස පාර, මිල්ලවිටිය, කුරුවිට පදිංචි එම්.පී. අශෝකා රංජනි මිය විසින් බදු මුදල් ගෙවීම අපහසු බව දන්වමින් ලිපියක් යොමුකර ඇති අතර ස්වාමිපුරුෂයා මියයාම,රැකියාවක්නොමැති කම හා දිගුකාලීන අසනීප,දරුවන් තිදෙනා පාසැල්යන වයසේ අය වීම ඇතුළු දැඩි ආර්ථික ගැටළු නිසා සානුකම්පිතව සලකා බලා මෙම වරිපනම් බදුමුදල් ගෙවීමෙන් නිදහස් කරදෙන ලෙස ඉල්ලා ඇත.මෙම ඉල්ලීම සමඟ මෙම තොරතුරු සත්‍ය බවට හා සමෘර්ධිලාභි පවුලක් බවට මිල්ලවිටිය ග්‍රාමනිලධාරි විසින් සහතික කර ඇත. කරුණු සලකා බලා වරිපනම් අංක 126/1 හිමි එම්.පී. අශෝකා රංජනි මියගේ 2022.06.30 දිනට පවතින හිඟ ශේෂය වන රු.825.62 ක මුදල අයකර 2022.06.30 දිනෙන්පසු බදුගෙවීමෙන් නිදහස් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
**එම යෝජනාව ස්ථිර කරමි.හිඟ අයකරගන්න.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව වරිපනම් අංක 126/1 හිමි එම්.පී. අශෝකා රංජනි මියගේ 2022.06.30 දිනට පවතින හිඟ ශේෂය වන රු.825.62 ක මුදල අයකර 2022.06.30 දිනෙන්පසු බදුගෙවීමෙන් නිදහස් කිරිමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-17.පුස්සැල්ල, පරකඩුව, පිහිටි ර/ සබරගමුව චන්ද්‍රෛස්කර කලායතනය වරිපනම් ගෙවීමෙන් නිදහස්කරගැනිමේ ඉල්ලීම සම්බන්ධ යෝජනාව.**
ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

පුස්සැල්ල, පරකඩුව, පිහිටි ර/ සබරගමුව චන්ද්‍රෛස්කර කලායතනය වරිපනම් ගෙවීමෙන් නිදහස්කරගැනිම සඳහා ඉල්ලීමක් කලායතනාධිපතිනි ඒ.ඩී.කේ.වයි චන්ද්‍රෛස්කර මිය විසින් ඉදිරිපත්කර ඇත.ඒ අනුව මෙම කලා ආයතනය සංස්කෘතික දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි බවත් කිසිදු ගාස්තුවක් අයකිරීමෙන් තොරව පවත්වාගෙන යන බවත් කුරුවිට සහකාර ප්‍රාදේශිය ලේකම් විසින් දැනුම් දී ඇත.එසේම සභාපකතේ 135/(ඇ)යටතේ හා කලායතන අත්පොතේ අනු අංක 35 ජේදය අනුවද මෙම කලායතන බදු මුදලින් නිදහස්කලහැකි බැවින්

වරිපනම් අංක 1104/7 හිමි ඒ.ඩී.කේ.වයි චන්ද්‍රෛස්කර මිය විසින් පවත්වාගෙන යන ර/ සබරගමුව චන්ද්‍රෛස්කර කලායතනය සඳහා ඉල්ලීම් කල දිනය වන 2022.02.22 දිනට පවතින හිඟ ශේෂය වන රු.15.22 ක මුදල අයකර ඉදිරියට බදු ගෙවීමෙන් නිදහස් යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
**එම යෝජනාව ස්ථිර කරමි**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව වරිපනම් අංක 1104/7 හිමි ඒ.ඩී.කේ.වයි චන්ද්‍රෛස්කර මිය විසින් පවත්වාගෙන යන ර/ සබරගමුව චන්ද්‍රෛස්කර කලායතනය සඳහා ඉල්ලීම් කල දින වන 2022.02.22 දිනට පවතින හිඟ ශේෂය වන රු.15.22 ක මුදල අයකර ඉදිරියට බදු ගෙවීමෙන් නිදහස් කිරිමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

2022.08.12 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක **05-18** සභා උද්ධෘතය

**05-18.** මෙනේරිපිටිය,පරකඩුව රජයේ හෝමියෝපති වෛද්‍ය මධ්‍යස්ථානය පිහිටි බහුකාර්ය ගොඩනැගිල්ලේ ජල සැපයුම සිදු කරන වතුර මෝටරය සම්බන්ධ යෝජනාව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

මෙනේරිපිටිය,පරකඩුව රජයේ හෝමියෝපති වෛද්‍ය මධ්‍යස්ථානය පිහිටි බහුකාර්ය ගොඩනැගිල්ලේ ජල සැපයුම සිදු කරන වතුර මෝටරය අක්‍රිය වී ආයතනයේ නිලධාරීන් හා සේවා ලාභීන් දැඩි අපහසුතාවයට පත්ව ඇති බැවින් අක්‍රිය වී ඇති වතුර මෝටරය පරීක්ෂාකර බලා පිලියම්යොදාදෙන ලෙස රජයේ හෝමියෝපති වෛද්‍ය මධ්‍යස්ථානයේ වෛද්‍යවරයා විසින් ඉල්ලීම් කර ඇත.මෙම බහුකාර්ය ගොඩනැගිල්ලේ රජයේ කාර්යාල කීපයක් පවතී.ඒ අනුව මෙනේරිපිටිය,පරකඩුව රජයේ හෝමියෝපති වෛද්‍ය මධ්‍යස්ථානය පිහිටි බහුකාර්ය ගොඩනැගිල්ලේ ජල සැපයුම සිදු කරන වතුර මෝටරය සම්බන්ධව කාර්මික නිලධාරී වාර්තා හා ලබාගෙන,ප්‍රතිපාදන ලැබෙන අයුරින් , නීත්‍යානුකූල අවශ්‍ය ඉදිරි කටයුතු කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා

**එම යෝජනාව ස්ථිර කරමි**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx**_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව මෙනේරිපිටිය,පරකඩුව රජයේ හෝමියෝපති වෛද්‍ය මධ්‍යස්ථානය පිහිටි බහුකාර්ය ගොඩනැගිල්ලේ ජල සැපයුම සිදු කරන වතුර මෝටරය සම්බන්ධව කාර්මික නිලධාරී වාර්තා හා ලබාගෙන,ප්‍රතිපාදන ලැබෙන අයුරින් , නීත්‍යානුකූල අවශ්‍ය ඉදිරි කටයුතු කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.**Xxxxxxxxxxxxxx**

2022.08.12 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක **05-18** සභා උද්ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

**05-19. වළඳුර වසමේ කැ.සි.620295 කලාප 06 කැබලි අංක 113 පර්වස් අක්කර 01 රූඩ් 01 ඉඩම කෘෂි කාර්මික කටයුතු සඳහා දීර්ඝ කාලීනව බදුලබාදීම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**වළඳුර වසමේ කැ.සි.620295 කලාප 06 කැබලි අංක 113 පර්වස් අක්කර 01 රූඩ් 01 ඉඩම කෘෂි කාර්මික කටයුතු සඳහා දීර්ඝ කාලීනව බදුලබාදීම සම්බන්ධව සහකාර ප්‍රාදේශිය ලේකම් කුරුවිට විසින් ඉල්ලීම් ලිපියක් ඉදිරිපත්කර ඇත.ඒ අනුව වලදූර වසමේ පවත්වන ලද ඉඩම් කච්චේරියෙන් හේවා තොන්ඩිලාගේ කෝකිලා මනෝරිද සිල්වා මිය හට වළඳුර වසමේ කැ.සි.620295 කලාප 06 කැබලි අංක 113 පර්වස් අක්කර 01 රූඩ් 01 ඉඩම කෘෂි කාර්මික කටයුතු සඳහා දීර්ඝ කාලීනව බදුලබාදීමට තීරනය වි ඇත.එම ඉඩම බදු ලබා දීම තුලින් නාගරික සංවර්ධන සැලැස්මට බාධාවක් සිදුවේද යන්න පරික්ෂාකර බදුලබාදීමට සභාවේ එකඟතාවය ලබාදෙන ලෙස ඉල්ලා ඇත.මේ සම්බන්ධයෙන් කාර්මික නිලධාරි වාර්තාද සපයා ඇති අතර හේවා තොන්ඩිලාගේ කෝකිලා මනෝරිද සිල්වා මිය හට වළඳුර වසමේ කැ.සි.620295 කලාප 06 කැබලි අංක 113 පර්වස් අක්කර 01 රූඩ් 01 ඉඩම කෘෂි කාර්මික කටයුතු සඳහා දීර්ඝ කාලීනව බදුලබාදීම සම්බන්ධයෙන් මහා සභාවේ අනුමැතිය ලබාදිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>
**එම යෝජනාව ස්ථිර කරමි**
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx**_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව
**හේවා තොන්ඩිලාගේ කෝකිලා මනෝරිද සිල්වා මිය හට වළඳුර වසමේ කැ.සි.620295 කලාප 06 කැබලි අංක 113 පර්වස් අක්කර 01 රූඩ් 01 ඉඩම කෘෂි කාර්මික කටයුතු සඳහා දීර්ඝ**

කාලීනව බදුලබාදීම සම්බන්ධයෙන් මහා සභාවේ අනුමැතිය ලබාදීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-20. කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් තලාවිටිය පොදු සුසාන භූමියේ ඇති අනතුරුදායක කොස් ගස් 09 හා ගිනිකූරු ගසින් ජන ජීවිතයට ඇති අනතුරුදායක තත්වය ඉවත් කිරිම සම්බන්ධ යෝජනාව.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

තලාවිටිය පොදු සුසාන භූමියේ නිවෙස් දෙකකට හා ප්‍රධාන මාර්ගයට අනතුරුදායක ලෙස පිහිටි කොස් ගස් 09 ක් හා ගිනිකූරු ගසක් සම්බන්ධ ව කාර්මික නිලදාරි වාර්ථාව ඉදිරි පත් කර ඇත. ඒ අනුව පහත විස්තර සදහන් අංක 1, 2 ,3, 4 කොස් ගස් ලාල් ආනන්ද යන අයගේ නිවසට ද අංක 5 ,6 ගස් සමන් තිලකසිරි යන අයගේ නිවසටද අනතුරුදායක බැවින්ද අංක 7 ,8 , 10 ගස් ප්‍රධාන මාර්ගයට හා විදුලි කම්බිවලට අනතුරු බැවින්ද ද අංක 9 කොස් ගස මැරී ඇති බැවින්ද පොදුවේ සියළු ගස් ජන ජීවිතයට අනතුරුදායක බැවින්ද සියළු ගස් කපා ඉවත්කිරිමට නීත්‍යානුකුල ක්‍රමවේදය අනුව මිල ගනන් කැඳවා කටයුතු කිරිමට යෝජනා කරමි.

මේ සම්බන්ධ කාර්මික නිලධාරි වාර්තාව පහත දක්වමි.

| | | වට අඩි | නිවසට දුර අඩි | උස අඩි |
|---|---|---|---|---|
| 01 | කොස් | වට අඩි 5.0 ʼʼ | 33.0ʼʼ | 70 පමණ |
| 02 | කොස් | වට අඩි 9.0 ʼʼ | 29.0ʼʼ | 80 පමණ |
| 03 | කොස් | වට අඩි 6.0 ʼʼ | 30.0ʼʼ | 80 පමණ |
| 04 | කොස් | වට අඩි 7.0 ʼʼ | 32.0ʼʼ( දිරා ඇත.) | 80 පමණ |
| 05 | කොස් | වට අඩි 7.0 ʼʼ | 34.0ʼʼ | 80 පමණ |
| 06 | කොස් | වට අඩි 8.0 ʼʼ | 22.0ʼʼ | 80 පමණ |
| 07 | කොස් | වට අඩි 5.0 ʼʼ (ප්‍රධාන මාර්ගය) | 25.0ʼʼ | 80 පමණ |
| 08 | කොස් | වට අඩි 6.0 ʼʼ (ප්‍රධාන මාර්ගය) | 30.0ʼʼ | 80 පමණ |
| 09 | කොස් | වට අඩි 4.0 ʼʼ(මැරී ඇත) | 30.0ʼʼ | 70 පමණ |
| 10 | ගිනිකූරු | වට අඩි 5.0 ʼʼ | 30.0ʼʼ | 80 පමණ |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග ආනන්ද මහතා

**එම යෝජනාව ස්ථිර කරමි. ඇතැම් පිරිස් නොදිරන අපද්‍රව්‍ය කැරකොප්පුවට දානවා.මේ සම්බන්ධව දැනුවත් කරන්න.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**පිරිසගෙන් මිල ගනන් ගන්න.වැඩිම තක්සේරුවට දෙමු.සති දෙකක් තුල මේ කටයුත්ත කරමු.**

**05-21. පොහොරබාව කසල අංගනයේ ඇති කසල කොම්පෝස්ට් කිරිම සඳහා සැල්ලඩ කිරිමට කි.ග්‍රෑ. 200 ප්‍රමානයේ හලර් යන්ත්‍රයක් සපයා ගැනිම සම්බන්ධ යෝජනාව.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**පොහොරබාව කසල අංගනයේ ඇති කසල කොම්පෝස්ට් කිරිම සඳහා සැල්ලඩ කිරීමට කි.ග්‍රෑ. 200 ප්‍රමානයේ හලර් යන්ත්‍රයක් සපයා ගැනීමට අවශ්‍ය බව කාර්මික නිලධාරි විසින් වාර්තා කර ඇත.ඒ අනුව**
**පොහොරබාව කසල අංගනයේ ඇති කසල කොම්පෝස්ට් කිරිම සඳහා සැල්ලඩ කිරීමට කි.ග්‍රෑ. 200 ප්‍රමානයේ සුදුසු හලර් යන්ත්‍රයක් කාර්මික නිලධාරි වාර්තා අනුව නීත්‍යානුකූලව මිලදිගැනිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
**එම යෝජනාව ස්ථිර කරමි.**
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා
**මේ පෝරවල ප්‍රමිතිය පරීක්ෂා කරන්න.කුඹුරු වලට හෙම දෙන පෝරවල ප්‍රමිතියක් නෑ.වැව් මඩත් තියෙනවා.සභාව මගින් හදන පෝර නිසි ප්‍රමිතියට හදමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ පොහොරබාව කසල අංගනයේ ඇති කසල කොම්පෝස්ට් කිරිම සඳහා සැල්ලඩ කිරිමට කි.ග්‍රෑ. 200 ප්‍රමානයේ සුදුසු හලර් යන්ත්‍රයක් කාර්මික නිලධාරිවාර්තා අනුව හා නීත්‍යානුකූලව මිලදිගැනිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05- 22. PF 7449 කැබ් රථය සඳහා ටයර් යෙදිම වෙනුවෙන් ලැබි ඇති මිල ගනන් සම්බන්ධ යෝජනාව.**

**PF 7449 කැබ් රථය සඳහා ටයර් යෙදිම වෙනුවෙන් කැඳවන ලද මිල ගනන් පහත පරිදි වේ.මෙම ටයර් යෙදීම සම්බන්ධව කාර්මික කමිටු අනුමැතිය ලැබී ඇත.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

| ආයතනය | භාන්ඩ වර්ගය | අවශ්‍ය ප්‍රමාණය | ටයර් වර්ගය (සන්නාම නාමය) | පොටවල් ගණන | නිෂ්පාදිත රට | එකක මිළ රු. | මුළු මුදල රු. |
|---|---|---|---|---|---|---|---|
| තක්ෂිල ටයර් හවුස්,කොළඹ පාර, හිදැල්ලන, රත්නපුර. | 265/70x16 ප්‍රමාණයේ ටයර් | 04 | Cooper | 10PR | USA | 105000.00 | 420000.00 |
| නිව් ලක්මිණි ටයර් මාර්ට්, නො.207, බටුගෙදර, රත්තපුර. | 265/70x16 ප්‍රමාණයේ ටයර් | 04 | Cooper | 10PR | USA | 99950.00 | 399800.00 |
| වුඩ්ලන්ඩ් ටයර් සර්විස්, 88ඒ, බණ්ඩාරනායක මාවත, රත්නපුර. | 265/70x16 ප්‍රමාණයේ ටයර් | 04 | Cooper | 10PR | USA | 103000.00 | 412000.00 |

ඉහත මිළගණන් අනුව අඩුම මිළගණන් ඉදිරිපත් කර ඇති නිව් ලක්මිණි ටයර් මාර්ට් ආයතනයෙන් PF-7449 කැබ් රථය සඳහා 265/70x16 ප්‍රමාණයේ / Cooper/10PR/ USA ටයර් 04ක් මිළ දී ගැනීමටත් ඒ වෙනුවෙන් රු.399800.00ක මුදලක් ගෙවීම් කිරීමටත් යෝජනා කරමි.

<u>**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**</u>

**එම යෝජනාව ස්ථිර කරමි.**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා**</u>

**අලයිමන්ට් දෝෂ නිවැරදි කල යුතුයි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව**
අඩුම මිළගණන් ඉදිරිපත් කර ඇති නිව් ලක්මිණි ටයර් මාර්ට් ආයතනයෙන් PF-7449 කැබ් රථය සඳහා 265/70x16 ප්‍රමාණයේ / Cooper/10PR/ USA ටයර් 04ක් මිළ දී ගැනීමටත් රු.399800.00ක මුදල ගෙවීම් කිරීමටත් **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-23. කුරුවිට ඒකාබද්ධ විශ්‍රාමික සමිතිය හා රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදලේ කුරුවිට ශාඛා කාර්යාලය ඉදිකරගැනීමට ඉඩමක් ඉල්ලීම සම්බන්ද යෝජනාව**

<u>**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**</u>

කුරුවිට ඒකාබද්ධ විශ්‍රාමික සමිතිය හා රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදලේ කුරුවිට ශාඛා කාර්යාලය ඉදිකරගැනිමට ඉඩම් ප්‍රමාණයක් 2022.08.05 දිනැති ලිපියෙන් ඉල්ලා තිබෙනවා. අප සභාවට අයත් කසල ප්‍රතිචක්‍රීකරන ගොඩනැගිල්ලට යාබදව ඇති පර්චස් .06 ක ඉඩ ප්‍රමානයයි ඉල්ලා ඇත්තේ. එසේම 2022.08.07 දිනැති ලිපියෙන් ද ඉල්ලීමක් සිදු කරමින් ඉඩම් ප්‍රමානයක් වෙනුවට කසල ප්‍රතිචක්‍රීකරන ගොඩනැගිල්ලට යාබදව ඇති උඩකඩ මාර්ගය හා පැරණි රේල්පාර අතර ඇති බිම් කොටසේ සුදුසු කාර්යාලයක් ඉදිකර ගැනීමට අවසර ඉල්ලා තියෙනවා. එම සමිතියේ ලේකම් විසින් මෙම ඉල්ලිම සිදු කර තියෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

**සභාව සතු දේපලක් වෙනත් ආයතනයකට හෝ යමෙකුට ලබා දීමට අපිට බලයක් නැ.රජයේ ඉඩම්.තාම අපිට අයිතිය පැවරිලත් නැ.මෙම සභාවේ ඉඩමේ කටයුත්ත සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කරන්න.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**මෙම ඉඩම සභාව වෙත නීත්‍යානුකූලව පැවරිලාත් නොමැති නිසා මෙම ඉඩම සම්බන්ධයෙන් තව දුරටත් කරුණු සොයාබලා වාර්තා ලබාගෙන, නීත්‍යානුකූල පැවරුම් කටයුතු සිදුකල පසුව** විශ්‍රාමික සමිතිය හා රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදලේ **ඉල්ලීම සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කිරිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx**_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව හා කුරුවිට ඒකාබද්ධ විශ්‍රාමික සමිතිය හා රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාර අරමුදලේ ගරු ලේකම්ගේ ඉල්ලීම අනුව කුරුවිට ප්‍රාදේශීය සභාව පිහිටි ඉඩමේ ශාඛා කාර්යාලයක් ඉදිකර ගැනිම සම්බන්ධ කටයුතු සළකා බැලීම සඳහා , සභාව පිහිටි ඉඩම සම්බන්ධයෙන් තව දුරටත් කරුණු සොයාබලා වාර්තා ලබාගෙන, එය නීත්‍යානුකූලව පැවරුම් කටයුතු සිදුකල පසුව ඉදිරි කටයුතු සිදු කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.**Xxxxxxxxxxxxx**

**05-24.කීරගල උඩවත්ත මාර්ගයේ අධිකලෙස ජලයෙන් යටවන ස්ථානය හියුම් පයිප්ප යොදා ජලය රැස්වීම වැලැක්වීම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**කීරගල උඩවත්ත මාර්ගයේ අධිකලෙස ජලයෙන් යටවන ස්ථානය හියුම් පයිප්ප යොදා සැකසිය යුතුබවත්1 ½ විශ්. අඩි 8 කැලි 01 , 1 ½ විශ්. අඩි 4 කැලි 01 බැගින් යොදා ජලය රැස්වීම වැලැක්වීම සඳහා කටයුතු කලයුතුබව වාර්තා කරඇත. මෙම ස්ථානය දැඩි ලෙස මාර්ගය ජලයෙන් යටවන අතර ජන ජීවිතයට පීඩනයක් වේ. ඒ අනුව කීරගල උඩවත්ත මාර්ගයේ අධිකලෙස ජලයෙන් යටවන ස්ථානය හියුම්පයිප්ප යොදා සැකසීම සඳහා අඩි 1 ½ විශ්. අඩි 8 කැලි 01 , 1 ½ විශ්. අඩි 4 කැලි 01 බැගින් මිලදීගැනිමට හා ස්ථානය සැකසිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

**එම යෝජනාව ස්ථිර කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

**වළඳුර පාසැල අසල පාර ත් යටවෙනවා. ජනතාව දැඩි අපහසුතාවට පත්වෙනවා.ගාමන්ට් එක ලගින් එන පාරත් යටවෙනවා. මේ අළ අවහිරවෙලා.ඒනිසා සභාවෙන් ස්කැවේටර් එක දාල හරි ඇළ කපලා දෙන්න.මිනිස්සුන්ගෙන හරි කමක් නෑ.මේ ඇල අවහිරතාවය ඉවත් කරන්න.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**ඒ කටයුත්ත සිදුකිරිමට කාර්මික නිලධාරි වාර්තාවක් හදලා ඉදිරි කටයුතු කරමු.වාර්තාවක් ගමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා ගේ යෝජනාව අනුව කීරගල උඩවත්ත මාර්ගයේ අධිකලෙස ජලයෙන් යටවන ස්ථානය හියුම්පයිප්ප යොදා සැකසීම සඳහා අඩි 1 ½ විශ්. අඩි 8 කෑලි 01 , 1 ½ විශ්. අඩි 4 කෑලි 01 බැගින් මිලදීගැනිමට හා ස්ථානය සැකසිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-25 ඇස්තමේන්තු-නොමැත.**

**<u>2022.08.12 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති යෝජනා අංක 06 – 01 (කාරක සභාවාර්තා ) හි උද්‍යතය</u>**

**06-01 මුදල් කමිටු වාර්තාව (2022.08.05)**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**2022.08.05** දිනැති මුදල් කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව සහා සම්මත කිරීමට හා එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එච්.කේ.එම්.එස්.එස්.ධනවර්ධන මහතා.**

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

වාර්තාවේ තීරන අංක 114 මෙය සේවක ඇප තැම්පත් ගෙවිමක්.ඒ නිලධාරින්ගේම මුදල්.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

ඒ අයගේ මුදල් ගෙවිය හැකියි.ගැටළුවක් නෑ.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

තීරන අංක 114 යටතේ සඳහන් කර ඇති සේවකයන්හට 12 දෙනා හට සේවක ඇප තැම්පත් ගෙවිම සුදුසු බවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

පසුගිය දිනවල ඩීසල් නැහැ කීවා.කසල ටික පවා ගැනීමට නොහැකි උනා.නමුත් ඇතැම් වාහන වලට ලීටර් 450 ක් ගහලා.ජේසීබී එකටත් 60 ක් ගහලා.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

රත්නපුර ,ඇහැලියගොඩ ෂෙඩ් වලින් ගහගත්තා.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

**යම් ගෙවීමක් කිරීමෙදි අපි අනිවාර්යෙන් ඒ පිලිබඳව විමසා බලා සිදු කල යුතුයි.ඩිසල්,පෙට්‍රල් වලටත් එය පොදුයි.තෙලුත් රත්තරන්වගේ මිල ඉහල ගිහින්.අවශ්‍ය ගමනක් හැර නිකරුනේ වාහන යවන්න එපා.ලේකම්තුමියත් වගකිම අනුව දිනපතා මේ ඉන්ධන පිලිබඳ සැලකිලිමත් වෙන්න.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

> **Xxxxxxxxxxxxxx 2022.08.05** දිනැති මුදල් කමිටු වාර්තාව වාර්තාව සභා සම්මත කිරීමට ත් මුදල් කමිටු වාර්තාවේ අංක114 යටතේ සඳහන් කර ඇති සේවකයන්හට 12 දෙනා හට සේවක ඇප තැම්පත් ගෙවිම සුදුසු බවටත් **වාර්තාවේ සඳහන් නිර්දේශයන් ක්‍රියාත්ම කිරීමත් සුදුසු බවටත් ඒකමතිකව මහා සභා** 2022.08.12 දින කුරුවිට **ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-13 සභා උදෘතයේ**

**06-02.කාර්මික කමිටු වාර්තාව (2022.07.18 )**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

22.07.18 **කාර්මික කමිටු වාර්තාව** සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**

22.07.18 කාර්මික කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට හා එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය.**

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxx 22.07.18 දින කාර්මික කමිටු වාර්තාව සභා සම්මත කිරීමට ත් එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්ම කිරීමත් සුදුසු බවට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

06-03 කුඩානගර ජලසම්පාදනක්‍රමයේ විධායකකමිටු රැස්වීම් වාර්තාව.(2022.07.01)

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

කුඩානගර ජලසම්පාදනක්‍රමයේ විධායකකමිටු රැස්වීම් වාර්තාව.( 2022.07.01) සභාවේ දැනුවත් වීම සඳහා ඉදිරිපත් කර ඇත.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**

මේ වෙලාවේ වැටුප් වැඩිකරන්න එපා.මූල්‍ය අර්බුධ තත්වය අඩුවුනාට පසු වැඩි කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි මංගල ඩයස් මහතා**

මාසික ආදායම් වියදම් වාර්තාව ලබාදෙන්න.අප්‍රේල් සිට ගෙවීම් වාර්තාදෙන්න.එසේම ජල සම්බන්ධතා ලබාගෙන ඇති අය ත් අළුතින් ගන්නකොට ආයේ ගෙවන්න වෙලා. මේක ගැටළුවක්.විසඳන්න.

**07 ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

07-01 -2022 ජුනි මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

2022 ජූනි මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

**එම යෝජනාව ස්ථිර කරමි. අදහසක්.මේ දිනවල පොලි අනුපාතය වැඩියි.සාමානය ගිණුම් වලට 22% දක්වා තියෙනවා.සෙන්ට්‍රල් බැංකුවේ තැන්පතුවලට 32% ගෙවනවා.මාස 6ට 7 ට පුළුවන් ස්ථිර තැන්පත් දාන්න පුළුවන්.වැඩි පොලියක් තියෙන තැනක මුදල් තැම්පත්කල හැකි නම් වාසියි.අපිට තියෙන සංචිත වටිනාකම් වලින් හැකි ප්‍රමානයක් .එසේම කිරිඇල්ල කඩ සම්බන්ධ ගත්ත ක්‍රියාමාර්ග මොනවාද?තක්සේරුවට ඇරියත් ඉදිරි කටයුතු කරන්න.අපේ කාලෙත් ඉවර වේගෙන එනවා.එසේම සභාවේ අනෙකුත් වියදම් දරාගත හැකි ලෙස කරමු.බුද්ධිමත්ව අවධානයෙන් ගෙවීම් කරන්න.අපිට ලැබීම් අඩුයි.අපි ඒත් බංකොලොත් වෙලා නෑ.දැන් කියන්නේ ඒ අවධානමට යන්න පෙරයි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx2022 ජූනි මස මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය, ආදායම් ඇස්තමේන්තුව,ඒකාබද්ධ වැය සාරාංශය, වියදම් ඇස්තමේන්තුව, ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**07-02 .2022.08.05 දිනට සභාවේ මූල්‍ය තත්වය**

**මේ සම්බන්ධව ගරු සභාපතිතුමන් විසින් වාර්තාව ඉදිරිපත් කරන ලදී.**

07-02 <u>2022 ජූලි මස ගෙවීම් වාර්තාව</u>

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>

2022 ජූලි මස ගෙවීම් වාර්තාව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා :-</u>

2022_ජූලි _මස ගෙවීම් වාර්තාව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ප්‍රේමා ගම්ලත් මිය.:-</u>

එම යෝජනාව ස්ථිර කරමි.

9476 ට්‍රැක්ටරය සඳහා බැටරි යෙදීම සම්බන්ධව ගැටළුව නිරාකරනය කරන ලදී.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්. ජයරත්න මහතා :-</u>

ඒඩීබී ගොඩනැගිල්ල අධියර තුනක් යටතේ වැඩ කලාට සභා මුදලින් ගෙවීමට තීන්දු කලේ ප්‍රථම අධියර විතරයි.2019 වසරේ.මේක නීති ගැටළුවක් වෙයි.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල  මහතා:-</u>

ඇස්තමේන්තු මහා සභාවේ අනුමත කරලයි ගෙවන්නේ. සියළු දෙනාව දැනුවත් කරලා මෙතෙක් ගෙව්වෙත්.මෙහි ගැටළුව කුමක්ද?

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්. ජයරත්න මහතා :-</u>
2019 වසරේ අනුමත කලේ අධියර 1 ට සභාමුදලින් ගෙවීමට.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල  ඩයස්  මහතා :-</u>
**සභා අවසර දුන්නේ පලමු අධියර සභා අරමුදලින් ගෙවිමටත් අනෙක් කොටස්වලට වෙනත් විකල්ප ක්‍රම මගින් මුදල් සොයාගැනිමටත්.1 අධියර සභාවේ අනුමතයි. අනෙක්වාට අනුමැතිය ගත්තේ නෑ.**
<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල  මහතා:-</u>
**ඇස්තමේන්තු ගෙවීම්  අනුමත කරලා කල දේවල් සඳහා ආයෙත් වෙනම ගෙවිමට  අනුමැතිය අනවශ්‍යයි.**
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්. ජයරත්න මහතා :-</u>
**මුදල් ප්‍රථම අධියරට සභාවෙන් ගෙවන්න අවසර ගත්තා.ඊළඟට මුදල් ගෙවන්නේ කොහෙන්ද කියලා නෑ.සභාවේ අනුමැතිය ගත යුතුයි.**
<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල  මහතා:-</u>
**ඇස්තමේන්තු යටතේ අවශ්‍ය අනුමැතීන් ලබාගෙන ඇත.**
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජන් ප්‍රදීප්  මහතා :-</u>
**ගියවර අයවැය යෝජනා යටතේ තිබුනා.පරිපූරකත් වෙන් කලා.**
<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

**වාරික දෙකක් ගෙව්වා.තව ගෙවන්න තියෙනවා.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx** 2022 ජූලි මස ගෙවීම්  වාර්තාව **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

08.වෙනත් කරුණු.

**08—01 කඩ සම්බන්ධව.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-**

නගරයේ පැරණි ගොඩනැගිල්ල ආසනයේ ලයිට් කණුව ලග ඇති ස්ථානය සභා අනුමැතිය ටෙන්ඩර් කරලයි දෙන්න කීවේ. නමුත් ඒක දීලා.මාස 2 ක බිල් කඩලා.ඒ විස්තර ලබාදෙන්න.

08-02-ආදාහනාගාරය ගැටළු

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජන් ප්‍රදීප් මහතා :-**

සභාවේ ආදාහනාගාරයේ වැසිකිලි වල වතුර නෑ.විමිනිය,වහලය තැනකින් කැඩිලා ඇත්වෙලා වහිනකොට වතුර වැටෙනවා ඇතුලට.අවධානය යොමු කරන්න.වැහිපීල්ලක් ගැලවිලා අනතුරුදායක විධිහට තියෙන්නේ .සුළඟට වැටිලා අනතුරක් විය හැකියි. මේවා ජනතාව වෙනුවෙන් අත්‍යවශ්‍ය කටයුතු .කඩිනමින් සකසන්න.

22.08.12 මහා සභාව -වෙනත් කරුනු 08-03 උද්‍ධෘතය

08-03 මස්කඩය සඳහා අවසර දීම

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**

බදුවත්ත ප්‍රෙද්ශයේ එක් ගව මස් කඩයක් තිබියදි තවත් ගව මස්කඩයක් දැමීමට අවසර ලබා දීමට කටයුතු සිදුවන බවත් සභාව මගින් ඒ සඳහා අවසර ලබාදිමට යන බව ට ආරංචි පවතින බැවින් ඒ සම්බන්ධයෙන් තම විරෝධතාවය හා ජනතා විරෝධතාවය පල කරමින් ශ්‍රී විමලාරාමවිහාරස්ථානය .අමුහේන්කන්ද හි නායක ස්වාමීන්වහන්සේ වන මුත්තෙට්ටුපිට විමලකිත්ති හිමි, ශ්‍රී කේතුමති විහාරස්ථානයේ විහාරාධිපති බුද්ධංකෝට්ටේ සුමන චන්ද්‍ර හිමි, වියලගොඩ මෙත්තාරාම විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍ය ගල්ලැල්ලේ ධම්මරතන හිමි,ශ්‍රී නාගබෝධි විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍ය ලුනුගල නන්දරතන හිමි යන ප්‍රෙද්ශයේ නායක හිමිවරුන් තම විරෝදය හා දායක සභාවේ දක්වා ලිඛිතව සභාවට ඉදිරිපත්කර ඇත.ඒ අනුව තව මස් කඩයක් දැමීමට පෙර මේ පිලිබඳ අවධානය යොමු කරන්න.දැනටත් කඩයක් තියෙනවා. ඒනිසා අවධානය යොමු කරලා කටයුතු කරන්න.

2022.08.12 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක **05-13** සභා උද්‍ධෘතයේ

2022.08.12 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක **05-13** සභා උද්‍ධෘතයේ

08-04 බදුවත්ත මංසන්ධියේ අනාරක්ෂිතභාවය ඉවත් කිරිම.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

බදුවත්ත මංසන්ධියේ අනාරක්ෂිතභාවය නිසා ජනතාවටත් අනතුරුදායකයි.ඒනිසා නිසි ලෙස බස්නැවතුම්පල ස්ථානගත කරලා පදික මංතීරු හදල විධිමත් කරන ලෙස ඇහැලියගොඩ පොලිසියටත් මාර්ග සංවර්ධන අධිකාරියටත් සබරගමු පළාත් ඉංජිනේරු සේවා අධිකාරිය ටත් දන්වන්න.

ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශිය සම්බන්ධිකරන කමිටුවටත් දන්වන්න.

08-05 <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද විජේ කුමාර මහතා :-</u>

අසංක එරන්ද ගරු මන්ත්‍රීතුමාගේ පියාත් මුදිතා මන්ත්‍රිතුමියගේ මැනියනුත් අභාවයට පත්වුනා. යාමට නොහැකිඋනා. ඒ සම්බන්ධයෙන් ශෝකය පල කරමි.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා:-**

අසංක ගරු මන්ත්‍රීතුමාගේ පියාත් මුදිතා මන්ත්‍රිතුමියගේ මැනියනුත් අභාවය පිලිබඳ සියළු දෙනාගේ ශෝකය පල කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජන් ප්‍රදීප් මහතා :-**

අසංක එරන්ද ගරු මන්ත්‍රීතුමාගේ පියාත් මුදිතා මන්ත්‍රිතුමියගේ මැනියනුත් අභාවයට පත්විම සම්බන්ධයෙන් එතුමිය හා පවුලේ සියළු දෙනාවෙත ශෝකය පල කරමි.

09-හදිසි යෝජනා

09-01 නිවාඩු අනුමත කිරීම

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණී දයා කස්තුරි මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසූරිය මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණී නයනා ජීවනි මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.කුලරත්න මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජීවන් අබේවික්‍රමපාල මහතා හදිසියේ අසනිප වි ඇති අතර නිවාඩු ලබා දිමට ගරු යෝජනා කරමි.හදිසි යෝජනා යටතේ ඉදිරිපත් කරමි.**

**ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණී ප්‍රේමා ගම්ලත් මිය**

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණී දයා කස්තුරි මිය, , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණී නයනා ජීවනි මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසූරිය මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.කුලරත්න මහතා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජීවන් අබේවික්‍රමපාල මහතා හදිසියේ අසනිප වි ඇති අතර නිවාඩු අනුමත කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

- **ස්තුතිය.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා:-**

අද දින මහා සභාව සඳහා සියළු සංග්‍රහ කටයුතු පෞද්ගලික මුදලින් සිදුකල **ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා හට ස්තුතිය පිරිනමන අතර අද දින සභාව සඳහා සහභාගි වී** සහය ලබාදුන් සියළු දෙනා හට ස්තුතිය පල කරමි.

සභාවේ කටයුතු ප.ව. 3.15 ට පමණ අවසන් කරන ලදී.

ප්‍රේමරත්න මල්කැකුළ
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

පිටපත් : -

01.කුරුවිට ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලා වෙතට - (දැ.ගැ.පි)

02.පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා - (දැ.ගැ.පි)

03.විගණකාධිපති,විගණකාධිපති උපකාර්යාලය,මහ නගර සභාව,රත්නපුර - (දැ.ගැ.පි)

04.ප්‍රධාන කාර්යාලයේ සියලුම වැඩසටහන් සහකාරවරුන්,සංවර්ධන නිළධාරීන්, කළමණාකාර සහකාරවරුන් හා කාර්මික නිලධාරීන් වෙතට - ඔබ විෂයට අදාල කටයුතු කිරීමට

05.කාර්ය භාර නිලධාරීන් - එල්ලාවල, කිරිඇල්ල, දොඩම්පේ - ඔබ කාර්යාලයට අදාල කරුණු ගැන අවධානය යොමු කිරීමට

06.ප්‍රජා සංවර්ධන නිලධාරී(දැ.ග.පි.)

- සභාපතිතුමා මුලසුන ගැනීම

**02.**ආගම සිහිකිරීම 01-1පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම. (2022.07.08 )

**01-02 විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව (2022.07.18 )**

**03.**සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන

**04.**ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ , පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන.

**05.** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -නැත.

**06.**<u>යථා පරිදි කල් දී ඇති යෝජනා-</u>

**<u>යථා පරිදි කල් දී ඇති යෝජනා යටතේ ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.</u>**

.

2022.08.12 මහා සභාව- වෙනත් කරුණු

08-04 බදුවත්ත මංසන්ධියේ අනාරක්ෂිතභාවය ඉවත් කිරිම.

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>**

බදුවත්ත මංසන්ධියේ අනාරක්ෂිතභාවය නිසා ජනතාවටත් අනතුරුදායකයි.ඒනිසා නිසි ලෙස බස්නැවතුම්පල ස්ථානගත කරලා පදික මංතීරු හදල විධිමත් කරන ලෙස ඇහැලියගොඩ පොලිසියටත් මාර්ග සංවර්ධන අධිකාරියටත් සබරගමු පළාත් ඉංජිනේරු සේවා අධිකාරිය වත් දන්වන්න.

ඒ සම්බන්ධයෙන් ප්‍රාදේශිය සම්බන්ධිකරන කමිටුවටත් දන්වන්න.